විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்

Department of Pensions



ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்க ஓய்வு
Sri Lanka Pension

වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්

வருடாந்த செயற்றிறன் அறிக்கை மற்றும் கணக்குகள்

ANNUAL PERFORMANCE REPORT & ACCOUNTS

2021

කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් 2021

වැය ශීර්ෂ අංකය 253

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10

පටුන

1. ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම 8

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු 9

1.3. ප්‍රධාන කාර්යයන් 10

1.4. සංවිධාන සටහන 11-12

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 13-20

පාලන අංශය 13

විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය 14

මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය 14-15

සත්කාර පියස 15

ප්‍රතිපත්ති අංශය 15

සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය 15-16

විදේශ විශ්‍රාම වැටුප් අංශය 16

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය 16

ගිණුම් අංශය 17-18

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 18-19

නීති අංශය 19

අභ්‍යන්තර විගණන අංශය 19

තොරතුරු තාක්ෂණ අංශය 19

මාධ්‍ය අංශය 19

තැපැල් අංශය 20

විශ්‍රාමික සංගම් පරිපාලනය සහ සම්බන්ධීකරණය 20

ව්‍යාපාරික අංශ සම්බන්ධීකරණය 20

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ව්‍යාපෘති 22-34

අභියෝග 35

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මඟ 35

3. 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 38

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 39

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 40

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 41

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 42

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 42

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....43

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.....43

3.9. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම් 44-45

3.10. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් (පළාත් සභා සහ මධ්‍යම රජය).....46-53

3.11. ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම 54-56

3.12. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගිණුම් 57-58

3.13. විගණකාධිපතිවරයාගේ වාර්තාව.....59-94

4. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).....96-100

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු.....102

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.....102

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.....104

6.3. මානව සම්පත් සංවර්ධනය.....104-105

7. අනුකූලතා වාර්තාව 107-114

1

ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විශ්‍රාමික ප්‍රජාවගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ අනාගත සුරක්ෂිතතාවය හා සුබසාධනය වෙනුවෙන් කැපවී සිටින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 1970.12.23 වන දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ "වී" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලද අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් වසර පනහකට අධික කාලයක් අනභිභවනීය මෙහෙවරක් ඉටුකරමින් සිටී.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් නීතිය 1898 ජූනි මස 23 වන දින 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත ක්‍රියාත්මක කරමින් ආරම්භ වී ඇති අතර එතැන් සිට විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණය කිරීම මහ භාණ්ඩාගාරය යටතේ සිදුවී ඇත. 1934 පෙබරවාරි මස 05 වන දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් සඳහා අදාළ කරගන්නා මූලික නෛතික ලේඛනය වන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 1947 අංක 02 දරණ අර්ථ නිරූපණ ආඥා පනතේ 02 වන වගන්තිය මඟින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීතියේ කොටසක් බවට පත් කර ඇති අතර පසුකාලීන අවශ්‍යතා මත 1972 මැයි මස 05 වන දින නැවත ප්‍රතිශෝධනය කර ඇත.

එවන් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත, 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත හා 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත හා පළාත් පාලන ආයතන සහ ගුරුවරුන් සම්බන්ධයෙන් වන විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ පිරිනමන මූලික නීති මත පදනම්ව ප්‍රතිලාභ හිමිගන්වනු ලබයි.

නවීන තාක්ෂණය හා කළමනාකරණ ක්‍රමවේද යොදාගනිමින් 672,000 කට අධික රජයේ විශ්‍රාමික ප්‍රජාව වෙත විවිධ අභියෝග හමුවේ වුව ද ඉතා සාර්ථකව හා අඛණ්ඩව ප්‍රතිලාභ ලබා දීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමත්ව සිටී. තවදුරටත් විශ්‍රාමික ප්‍රජාව වෙත සහන සැළසීමේ අරමුණින් පෞද්ගලික අංශය හා එක්ව විශ්‍රාමිකයා වෙත සුවිශේෂී වරප්‍රසාද හිමිකරදීමට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකි විය.

විශ්‍රාම දිවියට එළඹෙන විශ්‍රාමිකයා සෑම ආකාරයකින්ම සුරක්ෂිත කරමින් ද වැඩිවෙන වැඩිහිටි ජනගහනය විධිමත්ව කළමනාකරණය කරමින් ද සමාජ ආරක්ෂණය හා ආර්ථික කළමනාකරණ අභියෝග සාර්ථකව ජයගැනීමට රජයට සවියක්වීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අනුකූලව 2021 මුදල් වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදු කරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හා මූල්‍ය ක්‍රියාකාරකම් හි සාධනීය තත්ත්වය පිළිබඳ විස්තර ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions



දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්



මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

අරමුණු

- රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු හා අනත්දරු ආඥා පනත හා වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතට අනුකූල වන පරිදි හිමිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප හිමිගැන්වීම.
- මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අබණ්ඩව ගෙවීම හා වික්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව හිමිගැන්වීම.
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ හිමිගැන්වීම.
- රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කිරීම හා අනෙකුත් ආදායම් රැස්කිරීම හා කළමනාකරණය කිරීම.
- සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ කළමනාකරණය.
- සක්‍රීය සේවයේ යෙදී සිටිය දී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත් වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන් ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම.
- සමාජ ආරක්ෂණය පිළිබඳ ලෝක ප්‍රවණතා අධ්‍යයනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීම.
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබඳව ව්‍යවස්ථාදායකයට වගවීම.
- ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්වීම.

1.3. ප්‍රධාන කාර්යයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ථ කාර්යභාරය ක්‍රියාවලි හතරක් ඔස්සේ සිදු කරනු ලැබේ.

1.3.1 විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ප්‍රදානය

I. රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම

රාජ්‍ය සේවකයින්, අධිකරණ, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු සහ "ට" උප ලේඛනය ට ඇතුලත් කර ඇති නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම.

II. සන්නද්ධ සේවාවන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම

සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන්ට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම, වන්දි වැටුප් හා දීමනා, දුබලතා විශ්‍රාම වැටුප්, ස්ථාවර මාසික දීමනා හා යැපෙන්නන්ගේ දීමනා හිමිගැන්වීම.

III. වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම

සිවිල් අධිකරණ හා හමුදා සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයින් සඳහා මරණ පාරිතෝෂික හිමිගැන්වීම, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

IV. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ හිමිගැන්වීම

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම.

1.3.2 ගෙවීම් නියාමනය

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, උරුමකරු ගෙවීම්, විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම, විශේෂ වන්දි ගෙවීම්, විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම.

1.3.3 ලැබීම් නියාමනය

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි සමාජ සංරක්ෂණයන්ට අදාළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ලැබීම්, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ලැබීම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්, ගුරු වැන්දඹු හා අනත්දරු අරමුදලේ දායක මුදල් ලැබීම්, ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය කිරීම.

1.3.4 සංවර්ධන ප්‍රවේශය

රජයේ ප්‍රතිපත්ති රාමුව හා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම ඉලක්ක කර ගෙන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිරන්තර අධ්‍යයනය කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සේවාලාභීන්ට නැතහොත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් විශේෂ ප්‍රතිලාභ හිමිගැන්වීම හා රජයේ ඉලක්ක සපුරාගත හැකි වන පරිදි මානව හා භෞතික සම්පත් නිරන්තරව සංවර්ධනය කර ගනිමින් කටයුතු කිරීම.

1.4. සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ මණ්ඩලය (රා.සේ.අ.ඒ)
ගණකාධිකාරී (රා.සේ.අ.ඒ)
පරිපාලන නිලධාරී
ශාඛා ප්‍රධානී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක
ගණකාධිකාරී (දෙපාර්තමේන්තු ගෙවීම්)
ගණකාධිකාරී (ප්‍රසම්පාදන)
ගණකාධිකාරී (දායක මුදල්)
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී (පාරිතෝෂික)
ගණකාධිකාරී I
ගණකාධිකාරී (මාසික ගෙවීම්)
ගණකාධිකාරී (වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීම්)
ගණකාධිකාරී (විෂමතා)
සහායක කාර්ය මණ්ඩලය - 1
වෛද්‍ය උපදේශක
අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ)
සහකාර අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ)
අධ්‍යක්ෂ (විමර්ශන)
අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්)
සහකාර අධ්‍යක්ෂ (සත්කාර පියස)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (හමුදා)
සහකාර අධ්‍යක්ෂ (විදේශ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත)
සහකාර අධ්‍යක්ෂ (මධ්‍යගත)
සහකාර අධ්‍යක්ෂ(ප්‍රතිපත්ති)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නීති නිලධාරී
අධ්‍යක්ෂ (පාලන)
ස. අධ්‍යක්ෂ (මානව සම්පත්)
ස. අධ්‍යක්ෂ (පාලන)
භාෂා පරිවර්තක
ශාඛා ප්‍රධානී (කැඳැල්)
ශාඛා ප්‍රධානී (පාලන)
සහායක කාර්ය මණ්ඩලය - 1
සහායක කාර්ය මණ්ඩලය - 2

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය- 2021.12.31

තනතුරේ ස්වභාවය	තනතුර	අදාළ වන සේවය	වැටුප් ක්‍රමය	අනුමත මුළු තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්	SLAS (Special)	SL-3-2016	1	1	0
	අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්	SLAS (Special)	SL-3-2016	1	1	0
	වෛද්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම)	Primary Grade	SL-2-2016	1	0	1
	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ	SLAS (Class I)	SL-1-2016	4	3	1
	ප්‍රධාන ගණකාධිකාරී	SLAcS(Class I)	SL-1-2016	1	1	0
	ප්‍රධාන අභ්‍යන්තර විගණක	SLAcS(Class I)	SL-1-2016	1	1	0
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	SLAS(Class II or III)	SL-1-2016	10	10	0
	ගණකාධිකාරී	SLAcS(Class I)	SL-1-2016	1	2	-1
	ගණකාධිකාරී	SLAcS(Class II or III)	SL-1-2016	9	7	2
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	SLITS(Class II or III)	SL-1-2016	1	1	0
	නීති නිලධාරී	Dept	SL-1-2016	1	1	0
	පරිගණක මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත් පදනම)	Dept		3	2	1
				34	**30**	**4**
කෘෂීය මට්ටම	පරිපාලන නිලධාරී	PMAS (Supra)	MN-7-2016	4	3	1
	*භාෂා පරිවර්තක සිංහල -ඉංග්‍රීසි - 01 සිංහල - දෙමළ - 01	TS	MN-6-2016	2	1	1
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	SLICTS	MN-6-2016	5	1	4
				11	**5**	**6**
ද්විතීය මට්ටම	කාර්මික නිලධාරී	SLTS	MN-3-2016	1	0	1
	අයවැය සහකාර	RS	MN-4-2016	1	1	0
	විශ්‍රාම වැටුප් නිලධාරී	Dept.	MN-4-2016	233	201	32**
	සංවර්ධන නිලධාරී	DOS	MN-4-2016	505	465	40
	කළමනාකරණ සේවා නිලධාරී	MSO	MN-2-2016	190	163	27
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	SLICTS	MT-1-2016	5	4	1
	ලේඛණ සහකාර	Dept.	MN-1-2016	141	120	21
	Help Desk Operator	Dept.		2	0	2
				1078	**954**	**124**
පාථමික මට්ටම	බංගලා භාරකරු	Dept.	PL-1-2016	2	1	1
	අරක්කැමි / උද්‍යාන කම්කරු	Dept.	PL-2-2016	4	3	1
	රියදුරු	DS	PL-3-2016	12	7	5
	විදුලි කාර්මික	Dept.	PL-3-2016	1	0	1
	කාර්යාල කාර්ය සහායක	OES	PL-1-2016	56	41	15
				75	**52**	**23**
එකතුව				**1198**	**1041**	**157**

* භාෂා පරිවර්තක
සේවයේ නියුතු සේවක සංඛ්‍යාව - ඉංග්‍රීසි - දෙමළ - 01

** විශ්‍රාම වැටුප් නිලධාරී තනතුරු 30 ක් යටපත් කරමින් සංවර්ධන නිලධාරී තනතුරු 30 ක් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත.

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

පාලන අංශය

දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සිදු කිරීම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, විනය සම්බන්ධ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සැපයීම්, ඉදිකිරීම්, නඩත්තු, අළුත්වැඩියා කටයුතු හා සේවා කිරීම් සම්බන්ධයෙන් වන රාජකාරි කටයුතු මෙම අංශය මගින් සිදු කෙරේ.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් දිවයින පුරා නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක වූ කාලසීමාවේ වුව ද දෙපාර්තමේන්තුවේ 1970 ක්ෂණික දුරකතන අංකය, වීම කාර්යය සඳහා යොදවා ඇති නිලධාරීන්ගේ ජංගම දුරකතන හා සම්බන්ධ කර විශ්‍රාමිකයින්ගේ ගැටළු විසඳීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ලැබිණි.



2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත අනුව 2021 වර්ෂය තුළ විශ්‍රාමික තොරතුරු විමසීම් 113 ක් සඳහා පිළිතුරු සපයා ඇත. තවද ජනාධිපති කාර්යාලයෙන් සහ අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලද ලිපි සඳහා ද කඩිනමින් පිළිතුරු ලබා දී ඇත.

පැවති වසංගත තත්ත්වය හමුවේ වුවද සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන විශ්‍රාමිකයින්ගේ ගැටළු සඳහා අංශභාර මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ පිළිතුරු ලබාදීම සිදු කරන ලදී. ඒ අනුව 2021 වර්ෂය තුළ විශ්‍රාමික ගැටළු 5000කට ආසන්න ප්‍රමාණයක් සඳහා විසඳුම් ලබා දී ඇත.

තවද වීම කාල සීමාවේදී දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා විශ්‍රාමිකයින් හට තම විශ්‍රාම වැටුප් ගැටළු ඉදිරිපත් කර කලින් වේලාවක් වෙන් කර ගැනීමට අවස්ථාව සලසා දී තිබූ අතර වීමගින් ඔවුන්ගේ ගැටළු සඳහා ප්‍රමාදයකින් තොරව විසඳුම් ලබා දීමට කටයුතු කර ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික ප්‍රජාව ඇතුළු සමස්ථ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතන පාලනය හා නඩත්තු කිරීම් කටයුතු සිදු කලත් දිවයින පුරා ව්‍යාප්තව පැවති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ නිවාඩු නිකේතන පහසුකම් සැපයීම සීමා කරන ලදී. විශේෂයෙන්ම කැළණිය නිවාඩු නිකේතනය කොවිඩ් 19 රෝගය වැලඳුනු නිලධාරීන් රඳවා තබා ගැනීමේ හා ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් ද Lockdown කාල සීමාවේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන් හට නවාතැන් පහසුකම් සළසමින් ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සේවාවන් අඛණ්ඩව ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රජාවට ලබාදීමට උපයෝගී කර ගනු ලැබිණි.

විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය

විමධ්‍යගත ක්‍රමය මගින් විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ විශේෂත්වය වන්නේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ බලය සම්පූර්ණයෙන්ම ආයතන ප්‍රධානියා වෙත විමධ්‍යගත කිරීමයි. එසේ වුවද සියළුම රාජ්‍ය ආයතන විසින් විශ්‍රාම වැටුප් ප්‍රදානයට ප්‍රථම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගත (Online) ක්‍රමයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුවේ. එසේ අයදුම්පත් යොමු කිරීමේ මූලික අරමුණ වනුයේ විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් අංක ලබා ගැනීම, ප්‍රථම විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම හා පාරිතෝෂිකය ගෙවීම් කිරීම යන කරුණු සාක්ෂාත් කර ගැනීම උදෙසාය.



නිලධාරියා විශ්‍රාම ගැන්වීමේ දිනයට මාස 6කට පෙර සිට අදාල අයදුම්පත්‍ර මාර්ගගත (Online) ක්‍රමයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පහසුකම් සලසා ඇත. මෙම ක්‍රමය යටතේ විශ්‍රාම ගන්වන දිනම එම විශ්‍රාමිකයාට අදාල විශ්‍රාම වැටුප් ප්‍රදානය ලබා ගෙන රාජ්‍ය සේවය වෙනුවෙන් නිලධරයා කරන ලද කැප කිරීම් අගය කරනු පිණිස මෙන්ම ආත්මාභිමානයක් ඇති කරනු වස් ඔහු/ඇය ගෞරවාන්විතව විශ්‍රාම ගැන්වීමට ආයතන වලට හැකියාව ලැබී තිබේ.

නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක වූ කාල සීමාවේදී ද නිවසේ සිට රාජකාරී සිදු කිරීමේ වැඩපිළිවෙල (WFH) යටතේ විශ්‍රාමිකයින් හට අප්‍රමාදව ප්‍රථම විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමට කටයුතු කරන ලදී.

මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/1995 ප්‍රකාරව ආයතන ප්‍රධානීන්ට බලය ලබා දී ඇති විමධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම හැර ආයතන ප්‍රධානීන්ට බලය විමධ්‍යගත නොකරන ලද විශ්‍රාම වැටුප්, හිමිකම පරීක්ෂාකර ගෙවීම් කිරීමේ කටයුතු දක්වා සියළු කාර්යයන් මධ්‍යගත අංශය හරහා සිදුවේ.

ඉටු කෙරෙන කාර්යයන්

- විනය හේතු මත විශ්‍රාම ගන්වනු ලබන නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තිය)
- සේවා අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වන නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 15 වගන්තිය)
- වයස අවුරුදු 45 න් පසු පත්වීම් සහ වැටුප් රහිත නිවාඩු වසර 10 ට වැඩි විශ්‍රාමිකයින් විශ්‍රාම ගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වගන්තිය)
- තනතුර අහෝසි වීම මත හෝ ආයතනය වසා දැමීම මත විශ්‍රාම යන නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වගන්තිය)
- විශ්‍රාම වැටුප අහුරා තබා මණ්ඩලයකට හෝ සංස්ථාවකට ගොස් එම ආයතනයෙන් විශ්‍රාම ගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 48(ආ) වගන්තිය)
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2006, 07/2004, 44/90 යටතේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- වෛද්‍ය හේතූන් මත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 14 වගන්තිය)

- සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88)
- 2006.01.01 දිනට පෙර විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- "ට" උප ලේඛණගත නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 8/2015 හා 12/2009 යටතේ නිලධාරීන් විශ්‍රාම ගැන්වීම.

සත්කාර පියස



රාජ්‍ය නිලධාරියෙකු විශ්‍රාම ලබා ගත් පසුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට කැඳවා විශ්‍රාමිකයාගේ හා ඔහුගේ පවුලේ සාමාජිකයින්ට හිමි සියළු විශ්‍රාම වැටුප් හිමිකම් හා පසු ප්‍රතිලාභ තහවුරු කර දීම අරමුණු කරගෙන 2015 වර්ෂයේ දී සත්කාර පියස ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබිණි. විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප් අයදුම්පත පරීක්ෂාකර අනුමත කිරීමෙන් පසුව විශ්‍රාමිකයා විශ්‍රාම වැටුප සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා සත්කාර පියසට කැඳවා දත්ත පද්ධතිය හා භෞතිකව නිලධාරියාගේ අනන්‍යතාවය තහවුරු කර විශ්‍රාම වැටුප සක්‍රිය කිරීම, යැපෙන්නන්ගේ තොරතුරු සනාථ කර ගැනීමෙන් පසුව විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය නිකුත් කිරීම, විශ්‍රාමිකයාගේ ඇඟිලි සලකුණු ලියාපදිංචි කිරීම හා විශ්‍රාමික හැඳුනුම්පත්‍රය නිකුත් කිරීම සිදු කෙරේ.



ප්‍රතිපත්ති අංශය

රාජ්‍ය නිලධාරීන් සහ විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සම්පාදිතව පවත්නා ප්‍රතිපත්තිමය කරුණු අර්ථ දැක්වීම, අවස්ථානුකූලව වලෙස පවතින ප්‍රතිපත්තිමය කරුණු සංශෝධනය කිරීම හා රජයේ නව ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය චක්‍රලේඛ හා උපදෙස් නිකුත් කිරීම.



සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා නිලයන් සඳහා පිළිවෙලින් 1949 අංක 17 දරණ යුද්ධ හමුදා පනත, 1949 අංක 41 දරණ ගුවන් හමුදා පනත හා 1950 අංක 34 දරණ නාවික හමුදා පනත සහ ඒවාට කලින් කල සිදු කරනු ලබන සංශෝධන ප්‍රකාරව පනවනු ලබන ලද නීති රීති හා රෙගුලාසි අනුව සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ගෙවීම් කළමනාකරණය කිරීම සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශයෙන් සිදුවේ.

ඉටු කෙරෙන කාර්යයන්

- සේවා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- පරිවර්තිත, මරණ හා සේවා පාරිතෝෂික ගෙවීම් කටයුතු සිදු කිරීම.
- දුබලතා විශ්‍රාම වැටුප, යැපෙන්නන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව, අවු. 55 ප්‍රතිශෝධන, සන්නද්ධ සේවා හා පොලිස් වැන්දඹු ස්ථාවර දීමනා, සුරැකුම් දීමනා, විශේෂ වන්දි, නැවත සේවා සංශෝධන වැනි කටයුතු හා බැඳි ක්‍රියා සම්බන්ධීකරණය කිරීම.

විදේශ විශ්‍රාම වැටුප් අංශය



වසර දෙකකට වඩා වැඩි කාලයක් විදෙස්ගතව සිටින විශ්‍රාමිකයින්ගේ හා වෙනත් රටක පුරවැසිභාවය හෝ ද්විත්ව පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම්, වැටුප් සංශෝධන සහ විශ්‍රාමික ලිපිගොනු 10,000ක පමණ කටයුතු සම්බන්ධීකරණය, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් සිදුවේ.

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය



1898 අංක 01 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත හා ඊට අදාල සංශෝධන, 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ විධිවිධාන, 1970 අංක 18 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ බල සේනා) හා ඒ යටතේ පනවන ලද නියෝග මාලාව හා පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනතෙහි ප්‍රතිපාදනයන්ට යටත්ව ලියාපදිංචි කිරීම, සේවයේ යෙදී සිටියදී හෝ විශ්‍රාම ගිය පසු මිය යනු ලබන රජයේ නිලධාරීන්ගේ හෝ විශ්‍රාමිකයින්ගේ වැන්දඹුවන්ට/ වැන්දඹු පුරුෂයන්ට, අනත්දරුවන් හා ආබාධිත දරුවන් වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සම්බන්ධව කටයුතු මෙම අංශයෙන් සිදුවේ.

විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 09/2021 අනුව විශ්‍රාම වැටුප් ලබන අයෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට පැමිණීම අපහසු අවස්ථාවක භාරකරුවෙකු පත්කිරීම සම්බන්ධයෙන් පූර්ණ බලතල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරා ඇත.

ඉටු කෙරෙන කාර්යයන්

- සිවිල් හා අධිකරණ සේවා නිලධාරීන්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කිරීම.
- වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- ආබාධිත අනත්දරුවන් වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- මරණ පාරිතෝෂිකය හිමිගැන්වීම.

ගිණුම් අංශය



මෙම අංශයෙන් 253 වැය ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමත් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ගේ වැටුප් හා දීමනා සහ අනෙකුත් පහසුකම් සලසමින් පවත්නා නීති රීති වලට අනුකූලව මූල්‍ය කළමනාකරණය පවත්වාගෙන යනු ලැබේ.

මාසික ගෙවීම් අංශය

දේශීය සහ විදේශගත සියළු විශ්‍රාමිකයින්ගේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් නියාමනය කරමින්, විශ්‍රාමිකයින්ගේ බලාපොරොත්තු මල්ඵල ගන්වමින් රාජ්‍ය හා පෞද්ගලික බැංකු පද්ධතිය, තැපැල් කාර්යාල පද්ධතිය, ග්‍රාමීය බැංකු සහ සමූපකාර සමිති ඔස්සේ නියමිත දිනයන්හි දී මාසික විශ්‍රාම වැටුප් සියළු විශ්‍රාමිකයින් අතට පත් කිරීම මෙම අංශයේ කාර්යභාරයයි.

පාරිතෝෂික ගෙවීම් අංශය

සියළුම විශ්‍රාමිකයින්ගේ සහ පසු ප්‍රතිලාභීන්ගේ ප්‍රධානතම බලාපොරොත්තුව වන එක්වරක් පමණක් ගෙවීම් සිදුකරන විශ්‍රාම පාරිතෝෂික, මරණ පාරිතෝෂික සහ සේවා පාරිතෝෂික ගෙවීම් හා ඒ පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාම සහ මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යාම මෙම අංශයෙන් සිදුවේ.

විෂමතා අංශය



විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම යාමෙන් පසුව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම හෝ රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීම හෝ සංශෝධනය කිරීම හෝ ආයතනමය හේතුවක් නිසාවෙන් විශ්‍රාම වැටුපේ සිදුවන වෙනස්කම් වලට අනුකූලව විශ්‍රාම වැටුප් ගැලපීම හා හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම මෙම අංශය මගින් සිදුවේ.



වැන්දඹු අනත්දරු දායක මුදල් කළමනාකරණ අංශය

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සේවකයින්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් එක්රැස් කිරීම, යම් රාජ්‍ය සේවකයකු සේවය අවසන් කරන දිනට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලැබිය හැකි ප්‍රතිලාභීන් නොමැති විට හෝ ප්‍රතිලාභීන් සඳහා හිමිකමක් නොමැති විට රාජ්‍ය සේවකයාගෙන් අයකරනු ලැබූ දායක මුදල රාජ්‍ය සේවකයාට හෝ ඔහු හෝ ඇය මිය ගොස් ඇත්නම් ඔහුගේ හෝ ඇයගේ උරුමකරුවන් වෙත ආපසු ගෙවීම් කිරීම වැන්දඹු හා අනත්දරු දායක මුදල් අංශයෙන් සිදු කෙරේ. විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීම සඳහා අත්‍යාවශ්‍යම වන මුදලින් 40% ක් පමණ ලැබෙනුයේ මෙම අංශයෙනි.

සැපයුම් අංශය



වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ඉලක්ක අනුව දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා මත උපදේශන සේවා, භාණ්ඩ හා සේවා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අත්පත් කර ගැනීම, මිලදී ගැනීම හා භාණ්ඩ බෙදා හැරීම කළමනාකරණය කිරීම මෙම අංශයේ කාර්යය වේ.

වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය



රාජ්‍ය ආයතන විසින් මෙන්ම විවිධ ප්‍රතිපත්තිමය ගැටළු හේතුවෙන් විශ්‍රාමිකයින් හට වැඩියෙන් ගෙවී ඇති මුදල් නැවත අය කිරීම සහ රජයට අයකල යුතු යැයි දැනුම් දෙන අත්තිකාරම් බී ගිණුමේ ශේෂයන්, වැටුප් වැඩිපුර ගෙවීම් හා සේවා කාලය තුල සිදු කරන ලද වැරදීම් හා අතපසුවීම් වෙනුවෙන් වූ දණ්ඩන මුදල් විශ්‍රාම වැටුපෙන් අයකර අදාල ආයතන වෙත ප්‍රේෂණය කිරීම මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන වගකීමයි.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල



රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යටතේ 1942 අප්‍රේල් 01 දින මාසික වැටුප් ලබන, ස්ථිර, එහෙත් විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයින් සඳහා සේවා අවසාන මූල්‍ය ප්‍රතිලාභ සහතික කරනු වස් ආරම්භ කරන ලදී. 2003 අංක 17 දරණ සංශෝධන පනතින් හා වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ මගින් රාජ්‍ය සේවයේ නියුක්ත අනියම්, තාවකාලික, දෛනික වැටුප් ලාභීන්, කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් අයවලුන්, අභ්‍යාසලාභීන් ආදී පුළුල් පරාසයකින් යුත් සේවා කාණ්ඩයන් සඳහා ප්‍රතිලාභ ලබාගත හැකි වන පරිදි අරමුදලේ අරමුණු හා පරමාර්ථ පුළුල් කර ඇත.

ආරම්භයේ සිට මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 1970.12-23 දින සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව බිහිවීමෙන් පසුව ඒ යටතේ ක්‍රියාත්මක වන අතර, රාජ්‍ය පරිපාලන විෂය භාර ගරු අමාත්‍යවරයාගේ අධීක්ෂණය යටතේ වන අරමුදල් කළමනාකරණ මණ්ඩලය මගින් බලතල ක්‍රියාත්මක කෙරේ.

1. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)
2. උප නීතිපති (සොලිසිටර් ජනරාල්)
3. එක් එක් තැනැත්තා රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙකු හෝ ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ නියෝජ්‍ය වන තැනැත්තන් දෙදෙනකු
4. අරමුදලට දායක වන තැනැත්තන්ගෙන් එක් අයෙක්

වශයෙන් කළමනාකරණ මණ්ඩලය සමන්විත වේ.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබූ නිලධාරීන්ගේ වැටුපෙන් අයවන 8% ක දායක මුදලත්, සාමාජිකයා සේවය කරන ආයතනය විසින් ගෙවනු ලබන 12% ක දායක මුදලක් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල වෙත බැර වේ.

නීති අංශය



විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිය කාර්යයභාරය ඉටුකිරීමේදී නීතිපති දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වගඋත්තරකරු කරමින් උපරිමාධිකරණය ඇතුළු සියළු අධිකරණයන් වෙත ඉදිරිපත් කෙරෙන පැමිණිලි සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් සහ විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල සියළුම අණ පනත් පිළිබඳ අර්ථකථන හා නිර්දේශ ඉදිරිපත් කිරීමත් නිරීක්ෂණ ලබාදීමත් ආදී කටයුතු වෙනුවෙන් නීති අංශය ස්ථාපිත කර ඇත.

අභ්‍යන්තර විගණන අංශය



දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් ගෙවීම් හා මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය අධ්‍යයනය කිරීම තුළින් වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ක්‍රමවත් බව පිළිබඳව අඛණ්ඩව ස්වාධීන ඇගයීම පවත්වාගෙන යාම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබයි.

තොරතුරු තාක්ෂණ අංශය



විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂමව හා නිරවද්‍යව පවත්වාගෙන යාම සඳහා නිරන්තරයෙන් නව තොරතුරු තාක්ෂණ පද්ධති හඳුන්වා දෙමින් විශ්‍රාමික ප්‍රජාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ රාජ්‍ය ආයතන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ සෘජුව සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

මාධ්‍ය අංශය



සියළුම පුවත්පත් පිළිබඳව අවධානය යොමු කර විශ්‍රාම වැටුප් විෂයයට අදාල තොරතුරු රැස් කිරීම හා කළමනාකරණයේ අවධානයට වීම තොරතුරු ඉදිරිපත් කිරීම මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ. තවද තොරතුරු තාක්ෂණික සංවර්ධනය සමඟ තොරතුරු සන්නිවේදන කටයුතු නවීන තාක්ෂණික උපක්‍රම ඔස්සේ සිදුකිරීම දෙපාර්තමේන්තු මාධ්‍ය ඒකකය මඟින් සිදුවේ. එහිදී නිල වෙබ් අඩවිය, නිල Facebook පිටුව, නිල youtube චැනලය, වෙබ් සඟරාව හා විශ්‍රාම රේඩියෝව යන මාධ්‍යයන් ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම ද බාහිර මාධ්‍ය ආයතන වෙත තොරතුරු ලබාදීම ද මාධ්‍ය ඒකකය මඟින් සිදු කෙරේ.

තැපැල් අංශය



දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අභ්‍යන්තර සන්නිවේදනය ක්‍රමය ලෙස තැපෑල හඳුන්වා දිය හැකි අතර එම කටයුතු මනාව සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ. දෙපාර්තමේන්තුව වෙත ලැබෙන හා දෙපාර්තමේන්තුවෙන් පිටතට යැවෙන සියළුම ලිපි/ ලිපිගොනු නිවැරදිව හා කාර්යක්ෂමව අදාල අංශ/ආයතන වෙත යොමු කිරීම මෙම අංශයේ ප්‍රමුඛතම වගකීමයි.

විශ්‍රාමික සංගම් පරිපාලනය සහ සම්බන්ධීකරණය

විශ්‍රාමික ප්‍රජාව නියෝජනය කරමින් විශ්‍රාමික සංගම් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන විශ්‍රාමික ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, නිසි විසඳුම් ලබාදීම සහ දෙපාර්තමේන්තුව හා විශ්‍රාමිකයින් අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් එම කටයුතු සම්බන්ධීකරණය සඳහා වෙනම නිලධාරියෙකු අනුයුක්ත කර ඇත.

ව්‍යාපාරික අංශ සම්බන්ධීකරණය

විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගොස් ප්‍රතිලාභ ලබාදීම තුලින් ඔවුන් සක්‍රීය වැඩිහිටි ප්‍රජාවක් බවට පත්කිරීම අරමුණු කොට ගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව විවිධ නව්‍යකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. ඒ සඳහා දෙපාර්තමේන්තුව හා පෞද්ගලික අංශය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම මෙමගින් සිදු කෙරේ.

2

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ව්‍යාපෘති

- **ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතික ලබාදීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම.**

විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේ දී විශ්‍රාම වැටුප් ලාභියා ජීවතුන් අතර සිටින බවට තහවුරු කර ගැනීම සඳහා සෑම වර්ෂයකම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාමිකයින්ගෙන් ජීවිත සහතිකය ලබා ගැනීමේ පැවති සංකීර්ණ ක්‍රමවේදය වෙනුවට නවීන තාක්ෂණික ක්‍රමෝපායන් හා බද්ධ කරමින් ඇඟිලි සලකුණ භාවිතයෙන් සිය ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම 2020 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. ඒ අනුව එම පහසුකම තවදුරටත් පුළුල් කරමින් මෙම වර්ෂයේදීත් පහත පරිදි පහසුකම් සැලසීමට කටයුතු කර ඇත.

- 2021.02.01 දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2020 (සංශෝධන V) මගින් ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් සැපයීමේ වැඩපිළිවෙලෙහි සිව්වන අදියර යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා 20 ක් ඔස්සේ ද විශ්‍රාමිකයින් වෙත මෙම පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.





මාතර දී පැවති සමාරම්භක උත්සවය

- 2021.11.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2020 (සංශෝධන VI) මගින් මෙම පහසුකම මහජන බැංකු ශාඛා 125 ක් දක්වා තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කර ඇත.

- මේ අනුව දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පෑන් ඒෂියා බැංකු ශාඛා, මහජන බැංකු ශාඛා, ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛා සහ ප්‍රාදේශීය බැංකු ශාඛා ද ඇතුළුව බැංකු ශාඛා 340 ක් මගින් මෙම පහසුකම් ලබා ගැනීමට විශ්‍රාමිකයින් හට අවස්ථාව සලසා ඇත.

- **ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ ක්‍රමවේදය පහසු කිරීම.**

- විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 10/2021 මගින් සේවා කාලය අවුරුදු 10/12 ට වැඩි සේවා විශ්‍රාම වැටුප හා දුබලතා විශ්‍රාම වැටුප යන දෙකටම හිමිකම් කියනු ලබන සන්නද්ධ හමුදා සාමාජිකයින්ගේ සේවා විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට කටයුතු කර ඇත.

- දුබලතාවයට පත් සේවා විශ්‍රාම වැටුප්, වන්දි හා දීමනා ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් වයස අවුරුදු 55 දී ප්‍රතිශෝධන සේවා විශ්‍රාම වැටුප් අංකයෙන්ම ප්‍රතිශෝධන වැටුප ගෙවීම මෙම දෙපාර්තමේන්තුවෙන්ම සිදු කිරීම සඳහා විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 01/2021 මගින් අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.
- ත්‍රිවිධ හමුදා මරණ පාරිතෝෂික ගෙවීම් විධිමත් හා කඩිනම් කිරීම සඳහා 2021.11.15 දින සිට මරණ පාරිතෝෂික අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කිරීමට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2015(IV) මගින් අවශ්‍ය පහසුකම් සලකා ඇත.

- **පුද්ගලික පාසල් හා පිරිවෙන් ගුරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම විමධ්‍යගත කිරීම.**

- 2009.04.24 දිනැති හා අංක 1598/20 දරණ අති විශෙෂ ගැසට් නිවේදනය අනුව සහ 1953 අංක 44 දරණ පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව විශ්‍රාම වැටුප් හිමිකම් ලබන රජයේ අනුමත පුද්ගලික පාසල් සහ පිරිවෙන් ගුරුවරුන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට තීරණය කර ඇත.

  ඒ අනුව 2021.09.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2015 (සංශෝධන VI) මගින් 2021.10.01 දින සිට පුද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් විමධ්‍යගත ක්‍රමයට පූර්ණ මාර්ගගතව ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා දී ඇත.

- **කරුණාසහගතව දෙන ලද පාරිතෝෂික දීමනාව රු.50,000 දක්වා වැඩි කිරීම.**

2021.05.12 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2021 මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 44 වන වගන්තිය අනුව විශ්‍රාම වැටුපක් ගෙවීමට නොහැකි නමුත් එවැන්නක් ලැබීමට සුදුසු රජයේ සේවකයින්ට සහ දෙනික වැටුප් ලබන සේවකයින්ට හා විශ්‍රාම වැටුප් අහිමි තත්ත්වයේ සිටියදී මියයන රජයේ සේවකයින් වෙනුවෙන් වැන්දඹු හා අනත්දරු ආඥා පනත අනුව විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකි නම් ඔවුනට ද රු.50,000ක උපරිමයක් දක්වා කරුණාසහගත පාරිතෝෂිකයක් ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

- **යුද්ධයේදී මියගිය රණවිරුවන්ගේ පවුල් වලට විශේෂ ප්‍රතිලාභ.**

යුධමය වාතාවරණය පැවති වකවානුවේ මියගිය ත්‍රිවිධ හමුදා සහ විශේෂ කාර්ය බලකා ඇතුළු ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයන් හා යැපෙන්නන් වෙත ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීම සඳහා 2021.07.22 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2021 මගින් ප්‍රතිපාදන ලබාදීම. මේ සඳහා ත්‍රිවිධ හමුදාව හා ඒකාබද්ධව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

- **වැන්දඹු අනත්දරු සාමාජිකත්වය යාවත්කාලීන කිරීම.**

වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ 82/83 සහ M/F කාණ්ඩ යටතේ දැනට ලියාපදිංචි පැරණි සාමාජිකයින් සඳහා වැන්දඹු හා අනත්දරු ක්‍රමයේ නැවත ලියාපදිංචිය 2021.12.31 දිනෙන් අවසන් වූ අතර නිලධාරීන් 48,052 ක් නැවත ලියාපදිංචිය සිදු කර ඇත.

- **විශ්‍රාම වැටුප් අයදුම්පත් කළමනාකරණය පූර්ණ මාර්ගගත ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම.**

2021.01.29 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 (සංශෝධන V) මගින් 2021.02.01 දින සිට මාර්ගගතව (Online) පමණක් විමධ්‍යගත විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර ගෙන්වා ගැනීමේ ක්‍රමවේදය ආරම්භ කල අතර එමගින් තැපැල් ගාස්තු සඳහා වන වියදමෙහි යම් අඩුවීමක් ඇතිවූ අතර තැපෑල මගින් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී පැවති ප්‍රමාදය වළක්වා ගත හැකි විය. තවද අයදුම්පත්‍ර අදාළ ආයතනයෙන් ඉදිරිපත් කරන (submit) මොහොතේම දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට හැකිවීම තුළින් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ඇත.

- **කොවිඩ් තත්ත්වය යටතේ විශ්‍රාමිකයින් සුරක්ෂිත කිරීම.**

  - රට තුළ පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නව විශ්‍රාම වැටුප් හිමියන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම තවදුරටත් කඩිනම් හා වේගවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජුනි, ජූලි, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසයන්හි විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කරන ලද දිනයන්ට අතිරේකව විශ්‍රාමිකයින් (951, 48,15 හා 1,624) 2,638 දෙනකු සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කර ඇත.

  - රට තුළ පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්‍රාමිකයින් වෙත සහනයක් සැලසීමේ අරමුණින් මාර්ගගත පද්ධතිය ඔස්සේ විශ්‍රාම වැටුප් අයදුම්පත යොමු කර ඇති නමුත් අඩුපාඩු සහිත අයදුම්පත් සඳහා එම අඩුපාඩු නිවැරදි කරනු ලබන තෙක් වරින් වර අවස්ථා කිහිපයකදී විශ්‍රාම වැටුප හා සමාන දීමනාවක් විශ්‍රාමිකයින් වෙත ගෙවීමට කටයුතු කර ඇත.

  - ගෝලීය කොරෝනා වසංගත තත්ත්වය පැවතියදී අඛණ්ඩව දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කරමින් 672,000 කට අධික විශ්‍රාමිකයින්ට නියමිත දිනට විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කර ඇත.

- සේවා ඵලදායිතාවය වර්ධනය කිරීම උදෙසා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ "මහජන සේවාවන්" (Public Services) යටතේ ලබාදෙන තොරතුරු ප්‍රමාණය වැඩි කර ඇත.

රජයට ආදායම් උපයාදීම්

මෙම දෙපාර්තමේන්තුවට අයත් දැනට කුලී පදනම මත ලබා දී ඇති ගොඩනැගිලි සඳහා ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ගොඩනැගිලි කුලිය ලෙස රු.25,891,740 ක මුදලක් සහ නිවාඩු නිකේතනයන් මගින් රු.169,555 ක මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයාදී ඇත.

2021 වර්ෂයේ නිකුත් කර ඇති චක්‍රලේඛ

	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය
01.	04/2013 (iii)	2021-01-12	විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම
02.	03/2015 (V)	2021-01-29	විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම (විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම)
03.	02/2020(V)	2021-02-01	විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය
04.	01/2021	2021-05-12	කරුණාසහගතව දෙනු ලබන පාරිතෝෂිකය
05.	02/2021	2021-06-17	ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇති පොලිස් රණවිරුවන්ට හා ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය ශ්‍රී ලංකා පොලිස් රණවිරුවන්ගේ වැන්දඹු බිරින්දෑවරුන් වෙත රණවිරු සුරැකුම් දීමනාව ලබාදීම
06.	03/2021	2021-07-22	යුධමය වාතාවරණය පැවති වකවානුවේ මියගිය ත්‍රිවිධ හමුදා සහ විශේෂ කාර්ය බලකා ඇතුළු ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයන්ගේ යැපෙන්නන් වෙත සහන හිමිගැන්වීම.
07.	03/2015 (VI)	2021-09-10	විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම.(විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම)
08.	06/2011(II)	2021-10-15	විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ “ට” උපලේඛනය අර්ථකතනය කිරීම
09.	04/2021	2021-11-05	විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වූ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීම
10.	04/2021 (I)	2021-11-09	විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වූ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීම
11.	02/2020 (VI)	2021-11-10	විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය
12.	01/2019 (V)	2021-11-10	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට විශ්‍රාම වැටුප් ගැළපීම
13.	05/2021	2021-11-15	2022 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම
14.	09/2015 (IV)	2021-11-15	මරණ පාරිතෝෂික අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම

2021 වර්ෂයේ නිකුත් කර ඇති උපදෙස් ලිපි

	උපදෙස් ලිපි අංකය	නිකුත් කළ දිනය	කාරණය
1.	01/2021	2021.01.07	විශ්‍රාම වැටුප් ලබන අයෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට පැමිණීම අපහසු අවස්ථාවක භාරකරුවකු පත් කිරීම පිළිබඳ ගිවිසුම
2.	02/2021	2021.01.12	විවිධ රාජ්‍ය ආයතන වල සේවය කොට ත්‍රිවිධ හමුදා ස්වේච්ඡා බල සේනාව වෙත ඇතුළත්ව උපරිම වයස් සීමාවට එළඹ විශ්‍රාම වැටුපක් නොලබා සේවයෙන් ඉවත් වීමට සිදු වූ අයවළුන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.
3.	03/2021	2021.01.29	විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2020 අනුව මාර්ගගත ක්‍රමයට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම සඳහා වන උපදෙස් මාලාව.
4.	04/2021	2021.02.16	දුබලතාවයට පත් සේවා විශ්‍රාම වැටුප් හා වන්දි වැටුප් හා දීමනා ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් වයස අවුරුදු 55 දී ප්‍රතිශෝධනය කිරීම.
5.	05/2021	2021.03.31	මාර්ගගත ක්‍රමවේදය (Online) යටතේ ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන.
6.	06/2021	2021.04.23	විදේශයන්හි වසර දෙකකට වඩා වාසය කරන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ 2021 වර්ෂය සඳහා ජීවිත සහතික ලබා දීම.
7.	07/2021	2021.04.27	මධ්‍යම දත්ත පද්ධතියේ පරිශීලක ගිණුම් අවලංගු කිරීම.
8.	08/2021	2021.04.27	පරිශීලක නාම යාවත්කාලීන කිරීම.
9.	09/2021	2021.04.30	විශ්‍රාම වැටුප් ලබන අයෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට පැමිණීම අපහසු අවස්ථාවක භාරකරුවකු පත් කිරීම පිළිබඳ ගිවිසුම.
10.	10/2021	2021.09.10	සේවා කාලය අවුරුදු 10 / 12 ට වැඩි සේවා විශ්‍රාම වැටුප හා දුබලතා විශ්‍රාම වැටුප යන දෙකටම හිමිකම් කියන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
11.	11/2021	2021.09.10	ආබාධිත ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා වැන්දඹුවන්ට / වැන්දඹු පුරුෂයන්ට රණවිරු සුරැකුම් දීමනාව හිමිගැන්වීම.
12.	12/2021	2021.12.02	වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා පැරණි 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම.
13.	13/2021	2021.12.06	විශ්‍රාමික ජීවිත සහතිකය - 2022

2021 වර්ෂයේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් නිකුත් කර ඇති ගැසට් නිවේදන

	ගැසට් නිවේදන අංකය	නිකුත් කළ දිනය	කාරණය
01	2211/65	2021.01.22	කරුණාසහගතව දෙනු ලබන පාරිතෝෂිකය රු.50000.00 දක්වා වැඩි කිරීම
02	2234/24	2021.06.30	රජයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම
03	2235/52	2021.07.08	විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 අ අ වගන්තියට අනුව අර්ථකථනය කරන ලද "ට" උපලේඛනය සංශෝධනය කර නව තනතුරු ඇතුලත් කිරීම
04	2235/51	2021.07.08	විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 අ අ වගන්තියට අනුව අර්ථකථනය කරන ලද "ට" උපලේඛනය සංශෝධනය කර නව තනතුරු ඇතුලත් කිරීම
05	2235/60	2021.07.08	රජයේ සේවයේ නියුතු සියළුම ශ්‍රේණීන්ට අයත් වෛද්‍ය නිලධාරීන්ගේ, දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ හා හෙද නිලධාරීන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම
06	2248/59	2021.10.08	රජයේ සේවයේ නියුතු රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම

2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාර්යයන් පිළිබඳ වාර්තාව.

නීති අංශය

ගොනු හා ලිපි වර්ගය	ප්‍රමාණය	නිරීක්ෂණ ලබාදී ඇති ප්‍රමාණය	උපදේශන සඳහා සහභාගී වූ ප්‍රමාණය	අවසන් කිරීමට ඇති ප්‍රමාණය
මානව හිමිකම් පැමිණිලි	135	133	-	02
මානව හිමිකම් සිතාසි	19	19	19	-
ඔම්බුඩ්ස්මන් පැමිණිලි	143	143	03	-
වෙනත්	11	11	-	
ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	03	03	-	නඩු 03ක් සඳහා තීන්දු ලැබී නැත
අභියාචනාධිකරණ නඩු	07	07	03	01
පළාත් බද මහාධිකරණ නඩු	05	05	01	තීන්දු ලැබී නැත
නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් සඳහා ගොනු	04	-	-	
ආයතන සමඟ ඇති කර ගත් ගිවිසුම්	07	-	-	-
වෙනත් අංශ වලින් නිරීක්ෂණ සඳහා ලැබෙන ගොනු	44	42	-	02
එකතුව	**378**	**363**	**26**	

විශ්‍රාම වැටුප් ගෙවීම් - 2021

මාසය	සමස්ථ සක්‍රීය විශ්‍රාමිකයින් සංඛ්‍යාව			
	සිවිල්	හමුදෘ	වැන්දඹු හා අනත්දරු	එකතුව
ජනවාරි	362,386	112,555	185,664	660,605
පෙබරවාරි	362,315	113,274	185,718	661,307
මාර්තු	361,862	113,711	185,732	661,305
අප්‍රේල්	362,922	114,556	186,002	663,480
මැයි	365,896	115,466	185,860	667,222
ජුනි	366,669	116,129	185,863	668,661
ජුලි	365,971	116,387	185,442	667,800
අගෝස්තු	365,082	117,133	184,266	666,481
සැප්තැම්බර්	366,364	117,987	184,117	668,468
ඔක්තෝබර්	365,229	118,485	183,680	667,394
නොවැම්බර්	365,807	119,165	183,737	668,709
දෙසැම්බර්	367,998	119,942	184,256	672,196

සක්‍රීය කරන ලද නව විශ්‍රාම වැටුප් සංඛ්‍යාව සහ වැය වූ මුදල

මාසය	සිවිල්		වැ.අ.වි.වැ		හමුදෘ	
	විශ්‍රාමිකයින් ගණන	ගෙවන ලද මුදල (රු)	විශ්‍රාමිකයින් ගණන	ගෙවන ලද මුදල (රු)	විශ්‍රාමිකයින් ගණන	ගෙවන ලද මුදල (රු)
ජනවාරි	535	75,314,445	436	65,355,996	456	92,488,314
පෙබරවාරි	938	191,428,596	713	96,765,050	817	197,939,658
මාර්තු	1,005	239,715,685	672	165,960,126	608	178,636,381
අප්‍රේල්	1,819	446,633,915	898	136,933,068	968	285,738,525
මැයි	3904	324,235,945	555	143,759,128	1033	108,968,152
ජුනි	1421	130,573,664	485	101,475,380	800	88,410,672
ජුලි	467	91,046,818	372	87,892,111	420	73,974,839
අගෝස්තු	1,586	362,606,621	759	158,717,733	1140	225,070,916
සැප්තැම්බර්	2,273	396,795,692	391	72,282,869	929	161,619,036
ඔක්තෝබර්	699	152,081,516	348	71,236,978	642	116,640,330
ඔක්තෝබර්	699	152,081,516	348	71,236,978	642	116,640,330
නොවැම්බර්	1,802	433,937,971	752	185,223,593	856	169,100,722
දෙසැම්බර්	3,064	662,198,406	1257	271,230,348	966	152,590,806
එකතුව	**19,513**	**3,506,569,275**	**7,638**	**1,556,832,380**	**9,635**	**1,851,178,351**

වාර්ෂික විශ්‍රාම වැටුප් වියදම

වර්ෂය	වියදම (රු)
2016	164,028,280,465
2017	172,709,060,987
2018	182,014,784,493
2019	202,642,744,942
2020	229,080,763,894
2021	242,483,877,304

සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම් - 2021

ආයතනය	2021 දෙසැම්බර් දක්වා	
	සංඛ්‍යාව	ගෙවූ මුදල රු.බිලියන
යුද්ධ හමුදා	36,737	33.75
නාවික හමුදා	1,436	1.35
ගුවන් හමුදා	554	0.5
පොලිස්	1,937	2.11
ස්ථාවර දීමනා ගෙවීම්	830	0.19
එකතුව	**41,494**	**37.90**

පාරිතෝෂික ගෙවීම්

පාරිතෝෂික වර්ගය	ගෙවූ සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.)
සිවිල්, සන්නද්ධ සේවා හා මධ්‍යගත	24,459	27,162,264,255
හමුදා සේවා පාරිතෝෂික/ මරණ	878	568,313,212
මරණ පාරිතෝෂික	1,710	667,560,738
සංශෝධන	3,132	102,730,987
වෙනත් *	83	93,917,467
එකතුව	**30,262**	**28,594,786,658**

* විශේෂ වන්දි, නැවත සේවයේ පාරිතෝෂික ගෙවීම

විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන

මාසය	සංඛ්‍යාව	ගෙවූ මුදල (රු)
ජනවාරි	694	61,030,110
පෙබරවාරි	641	64,563,027
මාර්තු	683	66,078,469
අප්‍රේල්	708	49,860,796
මැයි	677	55,923,003
ජූනි	591	50,167,013
ජූලි	619	60,454,468
අගෝස්තු	681	66,198,646
සැප්තැම්බර්	632	45,720,634
ඔක්තෝබර්	548	58,598,418
නොවැම්බර්	690	50,433,520
දෙසැම්බර්	815	80,124,524
එකතුව	**7979**	**709,152,628**

වැන්දඹු අනත්දරු දයක මුදල් ආපසු ගෙවීම් -2021

	සිවිල්	හමුදා	පොදු 29
2020.12.31 ශේෂය	287	0	105
අයදුම්පත් ලැබීම්	1,264	2,155	36
අයදුම්පත් ගෙවීම්	749	2,139	28
අයදුම්පත් ආපසු යැවීම්	456	14	47
2021.12.31 ශේෂය	**346**	**02**	**66**

සන්නද්ධ සේවා අංශයෙන් මධ්‍යම දත්ත පද්ධතියට එකතු කල විශ්‍රාම වැටුප් සංඛ්‍යාව

විශ්‍රාම වැටුප් වර්ගය	ගෙවූ සංඛ්‍යාව (යුද්ධ/ ගුවන්/ නාවික)
සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් (අවු.10/12 ට අඩු)	423
හමුදා සංශෝධන	3,119
දුබලතා සේවා විශ්‍රාම වැටුප් ගෙවීම්	384
ප්‍රතිශෝධන (අවුරුදු 55 සම්පූර්ණ)	581
මරණ පාරිතෝෂික	11
සේවා පාරිතෝෂික	967
යැපෙන්නන්ගේ දීමනා	293
දුබලතා විශ්‍රාම වැටුප	351
ස්ථාවර දීමනා	852
සුරකුම් දීමනා	33
එකතුව	**7,014**

විශ්‍රාම වැටුප් ගෙවූ විදෙස්ගත විශ්‍රාමිකයින්ගේ විස්තර

මාසය	විශ්‍රාමිකයින් ගණන	ගෙවූ මුදල (රු)
ජනවාරි	9872	261,784,672
පෙබරවාරි	9845	274,140,189
මාර්තු	9849	272,390,958
අප්‍රේල්	9827	274,105,233
මැයි	9823	278,684,844
ජූනි	9823	269,504,809
ජූලි	9818	267,033,904
අගෝස්තු	8001	238,920,959
සැප්තැම්බර්	8022	215,892,699
ඔක්තෝබර්	8028	229,400,354
නොවැම්බර්	8069	230,203,084
දෙසැම්බර්	8186	249,983,552
එකතුව		**3,062,045,256**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් හා ගෙවීම්

මාසය	ලැබීම් (රු)	ගෙවීම් (රු)
ජනවාරි	212,786,322	7,878,183
පෙබරවාරි	120,688,483	20,278,357
මාර්තු	118,182,913	33,009,630
අප්‍රේල්	85,227,119	29,001,057
මැයි	48,038,293	23,029,298
ජූනි	13,354,732	19,914,757
ජූලි	124,895,088	34,226,504
අගෝස්තු	108,928,051	17,853,370
සැප්තැම්බර්	32,833,846	9,547,354
ඔක්තෝබර්	103,418,495	44,152,168
නොවැම්බර්	120,449,486	38,822,517
දෙසැම්බර්	99,370,998	75,468,782
එකතුව	**1,188,173,827**	**353,181,977**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක් වූ හා ඉවත් වූ සාමාජික සංඛ්‍යාව

මාසය	අලුතින් එක් වූ සාමාජික සංඛ්‍යාව	ඉවත් වූ සාමාජික සංඛ්‍යාව
ජනවාරි	391	282
පෙබරවාරි	463	301
මාර්තු	869	649
අප්‍රේල්	854	315
මැයි	405	113
ජුනි	233	127
ජුලි	602	508
අගෝස්තු	334	355
සැප්තැම්බර්	411	238
ඔක්තෝබර්	700	401
නොවැම්බර්	1,593	280
දෙසැම්බර්	2,522	308
එකතුව	**9,377**	**3,877**

ආදායම් ලැබීම්

ආදායම් කේතය	විස්තරය	එකතු කරන ලද ආදායම (රු)
8186	ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	289,919,297
පළාත් පාලන අරමුදල් ආදායම් ලැබීම්		
-	පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	0
-	පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	5,864
-	පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල	13,556,348
	එකතුව	**303,481,509**

වැටුප් හා අනෙකුත් පරිපාලන වියදම්

වර්ෂය	වටිනාකම (රු. ,000)
2017	29,005,842
2018	30,909,246
2019	34,262,885
2020	38,107,393
2021	38,591,300

ආයතනික පරිසරය වැඩිදියුණු කිරීම සහ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය හා සුබසාධනය

- සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් පොත්පත් පරිශීලනයෙන් ඈත් වෙමින් සිටින යුගයක දෙපාර්තමේන්තු නිලධාරීන් කියවීම සඳහා නැඹුරු කිරීම සහ එමඟින් ඔවුන්ගේ දැනුම් පරාසය පුළුල් කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ පැවති පුස්තකාලය නව මුහුණුවරකින් සහ පුළුල් විෂය පරාසයක පොත්පත් එකතුවක් සමග නැවත ආරම්භ කිරීම.





- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් මැද කොළඹ දිසා රෝහල සමග සහයෝගීත්වයෙන් සේවා අවශ්‍යතාව ඇති නිලධාරීන් සඳහා දන්ත සායන සහ බෝ නොවන රෝග සායන සඳහා යොමුවීමට අවස්ථාව ලබාදීම.
වැටුප් හා වේතන		**12,837,786**		13,115,471	
අනිකාල දීමනා		**311,731**		297,434	
දීමනා		**90,000**		82,000	
ලිපිද්‍රව්‍ය හා කාර්යාල වියදම්		**170,477**		320,255	
නිදහස් දුම්රිය බලපත්‍ර		**11,200**		52,580	
ප්‍රවාහන හා සන්නිවේදනය		**66,889**		72,453	
ක්ෂයවීම්		**427,508**		-	
වෙනත් වියදම්		**10,180**		6,790	
විගණන ගාස්තු		**260,000**	**14,904,137**	250,000	14,666,644
අතිරික්තය			**6,570,594,169**		7,627,899,989
එකතු කළා - පොදු සංචිතයෙන් මාරුකිරීම්.			-		586,290,971
දායකයන්ට විසර්ජනය කළ හැකි ආදායම			**6,570,594,169**		8,214,190,960
පොළී විසර්ජනය	**4**				
අනිවාර්ය දායකත්වය		**2,324,658,664**		2,143,541,635	
ස්වේච්ඡා දායකත්වය		**3,583,981**		3,318,544	
රජයේ දායකත්වය		**3,500,135,163**	**5,828,377,808**	3,216,774,115	5,363,634,294
විසර්ජනය කිරීමෙන් හා පොදු සංචිතයෙන් මාරු කිරීමෙන් පසු අතිරික්ත පොළී ආදායම			**742,216,361**		2,850,556,666

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

වත්කම්	සටහන	2021			2020	
		රු.			රු.	
ජංගම නොවන වත්කම්						
ආයෝජන වියදම	**3.1**	**28,132,904,205**	**28,132,904,205**		27,629,492,297	27,629,492,297
ජංගම වත්කම්						
ආයෝජනය පිරිවැයට		**52,875,556,722**			45,273,700,169	
ලැබිය යුතු පොලි	**3.2**	**2,437,338,409**			3,761,510,543	
ලැබිය යුතු රජයේ දායක මුදල්	**3.3**	-			39,848,381	
ගැලපුම් ගිණුම්	**3.4**	**29,811,315**			29,811,315	
භා.නි.ලේකම්ගේ ගිණුමේ ශේෂය		-	**55,342,706,446**		-	49,104,870,408
මුළු වත්කම්			**83,475,610,651**			76,734,362,705
මූලධන හා බැරකම්						
සමුච්චිත අරමුදල	**3.5**					
අනිවාර්යය දායක මුදල්		**31,284,678,563**			28,972,771,536	
ස්වේච්ඡා දායක මුදල්		**48,191,933**			44,799,765	
රජයේ දායක මුදල්		**48,313,024,475**	**79,645,894,971**		44,820,450,343	73,838,021,644
සංචිත						
ප්‍රාග්ධන සංචිත		**3,790**			3,790	
පොදු සංචිත	**3.6**	**3,592,773,027**	**3,592,776,817**		2,850,556,666	2,850,560,456
ජංගම බැරකම්						
උපචිත විගණන ගාස්තු		**1,153,760**			893,760	
නොගෙවන ලද රජයේ ප්‍රසාද මුදල්	**3.7**	**15,188,428**			25,683,616	
උපචිත වියදම්	**3.8**	**14,554,137**			14,334,644	
රජයට ලැබිය යුතු දායකත්වය		**201,255,073**			-	
භා.නි.ලේකම්ගේ ගිණුමේ ශේෂය		**4,787,465**	**236,938,863**		4,868,585	45,780,605
මුළු මූලධන සහ බැරකම්			**83,475,610,651**			**76,734,362,705**

3.13. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/ඊ/සීඔඉ/02//22/27 මෙම අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජූනි ২2 දින



අධ්‍යක්ෂ ජනරාල්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරාමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බව ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ මෙම වාර්තාවේ 2.1.1 (ආ),(ඇ),2.1.2(අ),(ආ),(ඇ), 2.4,2.5 ඡේදවල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් ලැබීම

වැඩියෙන් දැක්වීම

කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලයෙන් 2021 අප්‍රේල් මාසයට අදාල දායක මුදල් ලෙස 2021 ජුනි 25 දින ලැබී තිබුණු රු.2,904,049 ක ආදායමක් 20.04.02.00 (පළාත් සභා) ගිණුමට බැර කිරීම හේතුවෙන් පළාත් සභා ආදායම එම ප්‍රමානයෙන් වැඩියෙන් ගිණුම් ගත කර තිබිණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම (253-1-1-2103) යටතේ පරිගණක මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තුවක් සිදු කර නොමැත වුවත් රු.370,000 ක් වූ පරිගණක මිලදීගැනීම එම වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට නිකුත් කර තිබුණු රු. 775,187 ක වූ වත්කම් වලින් රු.117,720 ක් වටිනා පරිගණක යන්ත්‍රය සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොත් වල සටහන් කර නොතිබීමෙන් ගිණුම් වලින් ඉවත් වී ඇති අතර ඉතිරි රු. 657,467 ක් වටිනා ස්ථාවර වත්කම් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොත් වල සටහන් කර ඇති බවට විගණනයට තහවුරු නොවුණි.දෙපාර්තමේන්තුව මෙම වත්කම් පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර පරිගණක වාර්තාව (SA 80) අනුව 2021 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු. 228,365,377 වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු. 234,163,467 (පරිගණක මොඩුලයෙහි) විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් වල රු. 5,798,090 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

2.1.1 ආදායම් සංකේතය - 20:04:01:00 (මධ්‍යම රජය)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සංශෝධිත ආදායම රු.23,500,000,000 ක් වුවත් වර්ෂයේ ශුද්ධ ආදායම ලෙස රු.22,574,815,425 ක් පමණක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 3.94 ක අඩුවීමක් විය. මුදල් රෙගුලාසි 85(1) (ආ) ප්‍රකාරව පුරෝකථනය කල ඇස්තමේන්තු සංශෝධනය කල යුතු අවස්ථාවල දී ඒ පිළිබඳව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇස්තමේන්තු සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) වගන්තිය අනුව සෑම මසකම ගිණුම් සාරාංශ මඟින් හර හා බැර කරන ලද දායක මුදල් පිළිබඳ වාර්තාවක් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව දක්වා තිබුණ ද එම විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය තුළ දී බැර කරන ලද රු.22,595,155,044 ක දායක මුදල් පිළිබඳ වාර්තාවක් ගෙන්වා ගැනීමට කටයුතුකර නොතිබුණි.එසේම වර්ෂය තුළ සිදුකරන ලද රු.20,339,620 ක හර කිරීම් වලින් රු.19,569,428 ක හර කිරීම් තහවුරු කරගැනීම සඳහා අදාල ආයතනවලින් හර නිවේදන ලැබී නොතිබුණු අතර ඒ සඳහා සිහි කැඳවීම් ප්‍රමාදව සිදුකර තිබුණි.

(ඇ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අයත් ආදායම් සංකේත සඳහා මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවද මාසික කාර්යසාධන වාර්තා දින 10 ත් 221 ත් අතර ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි.

2.1.2 ආදායම් සංකේත අංකය 20:04:02:00 සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සංශෝධිත ආදායම රු.12,500,000 ක් ද රැස්කරන ලද ශුද්ධ ආදායම රු.12,043,826,499 ක්ද වූයෙන් අතර රැස්කරන ලද ශුද්ධ ආදායමේ අඩුවීම ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 3.65 ක් හෙවත් රු.456,173,501 ක් විය.

(ආ) 2021 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියලුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් වෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගෙන්වා ගත යුතුය. නමුත් අවම වශයෙන් ඊළඟ මාසයේ 20 වැනි දිනටවත් පෙර වෙක්පත් ලබානොදුන් පළාත් සභා 5 ක් දින 06 සිට දින 33 දක්වා කාල ප්‍රමාදයක් සහිතව වෙක්පත් ලබා දී තිබුණි.

(ඇ) ඌව පළාත් සභාව එක් එක් මාසයට අදාල දායක මුදල් ඇස්තමේන්තු කර චෙක්පතකින් ගෙවනු ලැබුව ද අදාල මාසයට අදාල හිඟ මුදල හෝ වැඩිපුර මුදල ගැලපීමට දින 05 සිට දින 133 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණි.

(ඈ) මධ්‍යම රජයේ හා පලාත් සභා නිලධාරීන්ගේ සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල්)සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. එබැවින් සමාජ සංරක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැතිවීම තුළ ඒ අනුව හිමිවන වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමිගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න දෙපාර්තමේන්තුව තුළින් තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

2.1.3 ගොඩනැගිලි කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්තමානයේ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 08 කින් රු. 4,348,265.81 ක හිඟ කුලී ආදායමක් හිඟව පැවති අතර මින් රු.1,583,100 ක් මාස 12 කට වඩා පැරණි ශේෂයන් විය.මින් රු.3,073,781.29 ක මුදලක් 2022 මැයි 30 වනවිට අයවී ඇතිබව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට පවත්වාගෙන යන ලංකා බැංකුව - ටෙලර් යන්ත්‍රය පිහිටි කොටසට හා 2021 මැයි 17 දින සිට කුලියට දී තිබුණ බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - II කොටස යන ආයතනවලින් කුලී ආදායම් රැස් කරගෙන නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව අනුව මහජන බැංකුවේ ටෙලර් යන්ත්‍රය පවත්වාගෙන යන පරිශ්‍රයෙහි තක්සේරු වටිනාකම රු.65,000 ක් වුවද මාසික කුලිය ලෙස රු.30,000 ක් පමණක් අයකර තිබුණි.

2.2 **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 ඔක්තෝබර් මාසය වෙනුවෙන් ගෙවන ලද රු. 40, 000 ක පරිගණක උපදේශක ගාස්තු 253-1-1-1002 (අතිකාල හා නිවාඩු දින වැටුප්) වැය විෂයයට හර කර තිබුණි.

(ආ) වැය විෂය අංක 253-1-1-1102(විදේශ ගමන් වියදම්),253-1-1-2507(පර්යේෂණ සහ සවර්ධන වියදම්) හා 253-1-1-1508 (වෙනත් මාරුකිරීම්) වැය විෂයයන් වල රු.5,900,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) වැය විෂයයන් 21 ක රු.134,350,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42 ක් එනම් රු.56,418,627 ක් ඉතිරි වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස වැය විෂයයන්වල 8%-80% අතර පරාසයක පැවතුණි.

2.3 **බැරකම් හා බැදීම්වලට එළඹීම**

2021 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ගෙවිය යුතු පාරිතෝෂික ලෙස රු.1,339,365,568 ක් දක්වා තිබුණ ද මින් රු. 155,531,324ක් 2022 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාස වලට අදාල ගෙවීම් විය.තවද 2022 අප්‍රේල් 08 දින දක්වා ගෙවන ලද 2021 දෙසැම්බර් මාසයට අදාල රු.191,594,939 ක ගෙවීම් 2021 දෙසැම්බර් 31 දිනට බැරකමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව රු.36,063,615 කින් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. .

2.4 **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම් සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(i) අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය		උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයකට යොමු කළ යුතු වුවත් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු නොකළ අවස්ථා 2 ක් විය.
(ii) මුදල් රෙගුලාසි 371(2) (ඇ)	85,785	තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය ඉටුකළ සැනින් පියවිය යුතු වුවත්, අවස්ථා 09ක දී නිලධාරීන් 4 දෙනෙකුට එක් අත්තිකාරමක් ලබා දී පියවීමට පෙර තවත් අත්තිකාරමක් ලබාදී තිබුණි.
(iii) මු.රෙ 103,104	113,846	විශ්‍රාම වැටුප් අංක 57-966 යටතේ ගෙවන ලද වන්දි දීමනාව, යැපීම් දීමනාව බවට පරිවර්තනය කිරීමේ දී රු.470,496 ක අධි ගෙවීමක් සිදුව තිබූ අතර එයින් තවදුරටත් අයවීමට ඇති මුදල අදාල විශ්‍රාම වැටුප් ලාභියා මිය ගිය 2021 පෙබරවාරි මස තෙක් අය කර ගැනීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 1645 (අ) හා 1646		දෛනික ධාවන සටහන් හා ගමන් පිළිබඳ මාසික සාරාංශය අදාල මාසයට පසු මාසයේ 15 වෙනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන 15න් 06 ක් මාස 8-12 අතර කාලයක් සඳහා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 1645 (අ)		වාහන 8 කට අදාල ලොග් සටහන් පොතේ ඇතුළත් කල යුතු සටහන් හා නොරතුරු නිසි පරිදි ඇතුළත් කර නොතිබුණි.
(vi) 2016 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 03/2016	465,500	2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා විශ්‍රාමිකයින්ට අන්තර් දීමනා හිමි නොවිය යුතු වුවත් පොල්ගහවෙල ,මාදම්පේ ප්‍රදේශීය ලේකම් කාර්යාල වලට අදාලව විශ්‍රාමිකයන් තුන්දෙනෙකුට අන්තර් දීමනාව ගෙවා තිබුණි.
(vii) 2019 මැයි මස 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2019 හි 04 වන වගන්තිය		රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති රෙගුලාසි ඇතුළත් අත් පොතේ 292 නියෝගය ප්‍රකාරව ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබමින් සිටි පුද්ගලයකුගේ මරණයක් ලියාපදිංචි කළ විට ඒ බව බී 73 දරණ පෝරමයේ ලියා සහියකට වරක් එහි පිටපතක් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත එවන ලෙස අදාල බල ප්‍රදේශයේ රෙජිස්ට්‍රාර්වරුන්ට උපදෙස් ලබාදිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(viii) 2013 ඔක්තෝබර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013	30,174	සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදවීමට හා ඒ අනුව අදාල ගෙවීම් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද සේවයේ යෙදීමෙන් පසු අනුමැතිය ලබාගත් අවස්ථා 09 ක් නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.
(ix) 2018 ජූනි 20 දිනැති හා අංක 01/2018 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 06 (b)	30,500	විදේශගත විශ්‍රාමිකයින් සඳහා ජීවන වියදම් දීමනා රු.2000 ක් විය යුතු බව දක්වා ඇතත් විදේශගතවී ඇති විශ්‍රාමිකයන් තුන්දෙනෙකුට රු.3525 ක ජීවන වියදම් දීමනාවක් ගෙවා තිබූ බැවින් වැඩිපුර ගෙවා තිබුණු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(x) 2014 අප්‍රේල් 07 වන දිනැති අංක 01/2011 සංශෝධන 1 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය		විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාසික විශ්‍රාම වැටුප් වියදම විශ්‍රාමිකයන් සංඛ්‍යාවේ සිදුවන එකතු කිරීම් අඩු කිරීම් සංශෝධන ඇතුළත් වාර්තාවක් මාසිකව සකස් කර දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ පාලන ගිණුම සමඟ සංසන්දනය කළ හැකි

		ක්‍රමවේදයකට පාලන ගිණුමක් සකස් කළ යුතු වුවත් කුරුණෑගල, කුලියාපිටිය (බටහිර) මාදම්පේ , ජා-ඇළ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එසේ සිදුකර නොතිබුණු බැව් නියදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.
(xi) 2009 ජනවාරි 07 දිනැති 1/2009 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය 08 ඡේදය		ආබාධිත දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු අධීක්ෂණය පූර්ණ වශයෙන් ග්‍රාම නිලධාරීන්ට පැවරිය යුතු අතර නිසි රැකවරණය ඔවුන් වෙත ලැබෙන බවට ග්‍රාම නිලධාරී වග බලා ගත යුතුය.ඒ සම්බන්ධයෙන් ඒ ඒ ආබාධිත ලිපිගොනුවල තේ‍ර මාසික වාර්තාවක් ගොනුවට ඇතුළත් කළ යුතු වුවත් කුරුණෑගල උඩුබද්දාව, මාදම්පේ, කුලියාපිටිය (බටහිර) යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතු කර නොතිබුණු බැව් නියදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.
(xii) 2019 ජුනි 11 දිනැති අංක 1/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය		අයවැය යෝජනාව අනුව 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගත් රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව විශ්‍රාම වැටුප් ගැලපීම 2019 ජූලි 01 දින සිට ගැලපීම් කළ යුතු වුවත් කුරුණෑගල,උඩුබද්දාව, කුලියාපිටිය (බටහිර) කුරුණෑගල, මාවතගම මල්ලවපිටිය, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියැදි පරීක්ෂාවේදී විශ්‍රාමිකයන් 181ක් සඳහා අදාල සංශෝධනයන් සකස් කර නොතිබුණි. මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපි ගොනු 52ක තොරතුරු දත්ත පද්ධතියේ නොමැති වීම හේතුවෙන් සංශෝධනය සකස් කළ නොහැකි වී තිබුණි.
(xiii) 2010 සැප්තැම්බර් 07 දිනැති 8/2010 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2014 ජනවාරි 10 දිනැති 1/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	2,899,825	රාජ්‍ය සේවකයකු ලබන රු. 7 800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත් මියගිය නාවික හමුදා රණවිරුවන් 10 දෙනෙකුගේ හමුදා වැටුප සමග රු. 7 800 ක ජීවන වියදම් දීමනාවක් ද හමුදා වැන්දඹු විශ්‍රාම වැටුප හෝ යැපුම් දීමනාව සමග රු. 3 525 ක ජීවන වියදම් දීමනාවක්ද ගෙවනු ලැබීමෙන් ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.

(xiv) 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	1,028,000	විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබා ගන්නා විට ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් අන්තර් දීමනාව ගෙවිය යුතු වුවද මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් 11 දෙනෙකුටද උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විශ්‍රාමිකයෙකුටද පිළිවලින් රු.759,000 ක් හා රු.269,000 ක් අන්තර් දීමනා ලෙස වැඩියෙන් ගෙවා ඇති බව නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.
(xv) 2013 දෙසැම්බර් 03 දිනැති අංක 6/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍ර ලේඛය හා 2011 ජූනි 14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍ර ලේඛ ලිපි අංක 02 පරිදි,	1,216,453	නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, දින 15 ත් දින 70 ත් අතර කාල පමාවක් සහිතව ප්‍රේෂණය කර තිබුණු අවස්ථා විය.
(xvi) 2015 අගෝස්තු 04 දිනැති අංක 05/2015 (11) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය		විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 6/2006 අනුව ගලපන ලද සංශෝධිත විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාව රු.3525 විය යුතුය. එසේ වුවත් වැන්දඹු විශ්‍රාම වැටුපක් ලබමින් සිට විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් 12 දෙනෙකු සඳහා සිවිල් විශ්‍රාම වැටුපට අදාල ජීවන වියදම් දීමනාව ගෙවා තිබුණද එදින සිට වැන්දඹු විශ්‍රාම වැටුපට අදාල වන ජීවන වියදම් දීමනාව ගෙවා නොතිබුණි.
(xvii) 2016 පෙබරවාරි 25 දිනැති අංක 3/2016 විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හි 7 වන වගන්තිය	112,000	විශ්‍රාම වැටුප් අංක 58 – 1265318 දරන විශ්‍රාමිකයා 2016 මාර්තු 28 දින විශ්‍රාම ගොස් තිබුණි. 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම යන නිලධාරීන්ට අන්තර් දීමනාව හිමි නැතත් මෙම නිලධාරියාට 2019 පෙබරවාරි 08 සිට 2021 දෙසැම්බර් 31 දක්වා අන්තර් දීමනාවක් ගෙවා තිබුණි
(xviii) 2014 ඔක්තෝබර් 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍ර ලේඛ ලිපි අංක 4 හි (iv) වන වගන්තිය		ප්‍රථම ගොනුව අදාල ආයතනයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මාස 03 ක් ඇතුළත එවිය යුතු වුවත් ජූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දීර්ඝ කාල ප්‍රමාදයකට පසුව එවා තිබූ ගොනු 02ක්ද ජූජාපිටිය හා පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලැබී නොතිබූ ගොනු 06 ක්ද පැවතුණි,එහෙත් ඒ පිළිබඳව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර නොතිබුණි.

(xix)	ප්‍රසම්පාදන අත් පොතෙහි 8.7.1 හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2	3,965,576	රම්බොඩ විශ්‍රාමික නිවාඩු නිකේතනයෙහි අලුත්වැඩියා කටයුතු, ආරක්ෂිත කළුගල් බැමීම හා දැල් වැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රතිග්‍රහණ ලිපියෙහි වැඩ ආරම්භ කිරීමේ දිනය, කාර්යසාධන ඇපකරයේ වටිනාකම හා ඇපකරය ලබා දිය යුතු දිනය ඇතුලත් කර නොතිබු අතර පිරිවිතර සහ කොන්දේසි වලට අනුව වැඩ නිම කර ඇති බවටත්, සහතික කරන ලද ගෙවීම්, කොන්දේසි වලට අනුකූල බවටත් සහතික කරමින් වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් කර නොතිබුණි.

2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කේවල ශේෂ එකතුව රු.172,979,542 ක් වී තිබුණු අතර එයින් වසර 03 කට වඩා වැඩි කාලයක සිට අයවීම් හිහව පැවති ශේෂය රු.841,174 ක් ව තිබුණි. එම ශේෂවලින් නිලධාරීන් 07 දෙනෙකුගේ වසර 5 ට වැඩි ශේෂය රු.747,639 ක්ද, එක් නිලධාරියකුගේ වසර 3 – 4 අතර ශේෂය රු.93,535 ක්ද විය.

2.7 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාමික දිනය වෙනුවෙන් ලැබුණු වර්ෂ 02 ක් ඉක්මවූ රු.4,413,050 ක තැන්පත් මුදල් රෙගුලාසි 571(3) පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව වසර 2 ක් ඉක්මවූ තැන්පතු ආදායමට ගැනීමට හෝ නිදහස් කිරීමට කටයුතු කළ යුතු වුවත් රු.128,169 ක තැන්පතු සම්බන්ධයෙන් ඊට පටහැනිව කටයුතු කර තිබුණි.

(ඇ) හඳුනානොගත් ලැබීම්

2021 දෙසැම්බර් 31 බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනානොගත් ලැබීම් වටිනාකම රු.24,529,929 ක් වූ චෙක්පත් 242 ක් විගණන දිනය වන විට හඳුනාගෙන තිබුණද ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) අක්‍රීය බැංකු ගිණුම්

පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041643 දරන ලංකා බැංකු ගිණුම හා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041644 දරන ලංකා බැංකු ගිණුම්හි ගනුදෙනු සිදුනොවන බැවින් ඒවා අක්‍රීය බැංකු ගිණුම් ලෙස පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 25 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලට වර්ෂයට අදාල යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ සැලැසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුලත්ව නොතිබුණි.

(ආ) 2017 සිට වර්තමානය දක්වා ක්‍රියාත්මක වැන්දඹු හා අනත්දරු නව ලියාපදිංචිය හා නැවත ලියාපදිංචිය ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන නොතිබු බැවින් ඒවායේ කාර්යසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඇ) ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනාගෙන ප්‍රමුඛතාව අනුව ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පර්යේෂණ හා සංවර්ධනය සඳහා රු. මිලියන 2 ක ප්‍රතිපාදන වෙන්කර තිබුනද එම කාර්යයන් සිදුකර නොතිබුණි

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

ක්‍රියාකාරී සැලැස්මට අනුව මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් යටතේ කැලණිය නිවාඩු නිකේතනයේ ශ්‍රවනාගාරය හා මුතුපියස නවීකරණයට හා කැලණිය තට්ටු ගොඩනැගිල්ලෙහි නාන කාමර අලුත්වැඩියාව සඳහා මිලියන 13 ක ප්‍රතිපාදන සලසා තිබු අතර සැලැස්මට අනුව ජූලි මාසයේ දී මෙම කාර්යය සියයට 20 කින් නිමකළ යුතු විය. එහෙත් සැලසුම් කර නොතිබූ රම්බොඩ නිවාඩු නිකේතනය නවීකරණය වෙනුවෙන් රු.මිලියන 4.3 ක් වැයකර එම නවීකරණ කටයුතු සම්පූර්ණයෙන්ම නිමකර තිබූ අතර සැලැසුම් කරනිබූ කැලණිය නිවාඩු නිකේතනයේ නවීකරණ කටයුතු වෙනුවෙන් රු.ලක්ෂ 4 වැයකර තිබූ අතර ප්‍රගතිය සියයට 35 ක් පමණක් විය.

3.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබූ දිස්ත්‍රික් අනුව විශ්‍රාම වැටුප් සක්‍රීය අංශ හඳුනාගැනීම හා Scanner 10 ස්ථාපිත කිරීමේ කාර්යසාධනය 2021 සැප්තැම්බර් වනවිට සියයට 100 ප්‍රගතියක් ලෙස දැක්වුව ද 2021 අප්‍රේල් වනවිට මිලදීගෙන තිබූ ස්කෑන් යන්ත්‍ර 10 න් 3ක් 2021 නොවැම්බර් 19 වනවිට රත්ගම, මාදම්පාගම හා වදුරඹ යන ප්‍රාදේශීය කාර්යාලවලට ස්ථාපිත කර තිබුණ ද ස්කෑන් යන්ත්‍ර 7 ක් විගණන දිනය වන විට ද (2022.02.18) ගබඩා අංශයේ පැවතුණි. මේ අනුව දෙසැම්බර් මස වනවිට දක්වා ඇති කාර්යසාධන අගයන් නිවැරදි නොවුණි.

3.2 ප්‍රසම්පාදනයන්

3.2.1 Firewall ආරක්ෂක පද්ධතිය මිලදී ගැනීම

වර්තමානයේ ස්ථාපනය කර ඇති 2021 ජූනි 21 දින මිලදී ගත් රු.1,928,700 ක්වූ නව ආරක්ෂක පද්ධතිය **සඳහා** සියයට 85 ක් ගෙවීමෙන් පසු , ඉතිරිය තාක්ෂණ ඇගයීමකින් පසු නිදහස් කරන බවට ගිවිසුම් ගතව තිබුණත් පද්ධතියේ ආරක්ෂණ හැකියාව පිළිබඳව හා දෝෂ හඳුනා ගැනීමේ හැකියාව පිළිබඳව තාක්ෂණ විගණනයක් සිදු කල හැකි පිළිගත් ආයතනයකින් ලබා ගත් තාක්ෂණ ඇගයීමකින් තොරව 2021 ඔක්තෝබර් මස 11 දින රු.289,305 ක්වූ ඉතිරි මුදල් ගෙවා තිබුණි.

3.2.2 Desktop computer 15 ක් මිලදී ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගබඩා වවුචෝරු පොත අනුව රු.2,088,600 වූ පරිගණක යන්ත්‍ර 15 ක් 2021 අප්‍රේල් 21 දින ගබඩාවට ලැබී තිබූ අතර විගණිත දිනවන විට එම පරිගණකවලින් 3 ක් පමණක් 2021 නොවැම්බර් 11 දින නිකුත් කර තිබූ අතර ඉතිරි පරිගණක 12 ගබඩාවේ පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රසම්පාදන අත්පොතෙහි 5.4.8 ප්‍රකාරව පරිගණක යන්ත්‍ර 15 ක් මිලදී ගැනීමේදී කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

3.2.3 ඇඟිලි සලකුණු යන්ත්‍ර 15 ක් මිලදී ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවිතර සැකසීමේ දී වගකීම් කාලය සඳහා කාලසීමාවක් දක්වා නොතිබීමෙන්, වගකීම් කාලයක් රහිතව මිලදී ගැනීමට සිදුවීම.

(ආ) පිරිවිතර සකස් කරන ලද්දේ කවුරුන් විසින් ද ,අනුමත කරන ලද්දේ කවුරුන් ද යන්න හඳුනාගැනීමට අත්සන යොදා මුද්‍රා තබා නොතිබුණි.

(ඇ) ආයතන 3 කින් පමණක් මිලගණන් ඉදිරිපත් කර තිබුණු අතර ඉන් 2 ක් පිරිවිතරවලට බැහැර වන නිසා තාක්ෂනික ඇගයීම් කමිටුව ප්‍රතික්ෂේප කර එක් ආයතනයක් මත පදනම්ව මිලදී ගැනීම් සිදුකර තිබූ බැවින් තරහකාරී බවත් ඇතිව සැපයුම්කරු තෝරා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) පිරිවැය රු.510,000 වූ ඇණිලි සලකුණු යන්ත්‍ර 15 ක් ගබඩා වට්ටෝරු ලේඛනය අනුව 2021 අප්‍රේල් 25 හාරගෙන ඇති අතර විගණිත දින වන(2022.02.28) විටත් එම යන්ත්‍ර 15 නිකුත් නොකර ගබඩාවේ තිබුණි

3.2.4 මුද්‍රණ යන්ත්‍ර 10 ක් හා ස්කෑනර් යන්ත්‍ර 15 ක් මිලදී ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) අලුතින් ස්ථාපිත නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය පරිගණක උපකරණ ලෙස මුද්‍රණ යන්ත්‍ර 9 ක් හා ස්කෑනර් යන්ත්‍ර 9 ක් මිලදී ගැනීමටද මුද්‍රණ යන්ත්‍ර 1 ක් මධ්‍යගත අංශය සඳහා මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබූ අතර ඊට අමතරව ස්කෑනර් යන්ත්‍ර 6 ක් මිලදී ගෙන තිබුණද කුමන අංශවල කවුරුන් සඳහා අවශ්‍යවේද යන්න පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ස්කෑනර් යන්ත්‍ර 15 ක් 2021 ඔක්තෝබර් 06 දින ගබඩාවට ලැබී තිබුණු අතර 2021 දෙසැම්බර් 19 දින යන්ත්‍ර 3 ක් පමණක් නිකුත් කර තිබුණු අතර ඉතිරි 12 ගබඩාවේ තිබුණි.

(ඇ) මුද්‍රණ යන්ත්‍ර 10 ක් 2021 අගෝස්තු 03 දින ගබඩාවට ලැබී තිබුණු අතර 2021 නොවැම්බර් 19 දින වනවිට යන්ත්‍ර 3 ක් පමණක් නිකුත් කර තිබුණු අතර ඉතිරි 7 ක් ගබඩාවේ තිබුණි.

(ඈ) මේ අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදිත මුදලින් 60% ක් එනම් රු.2,642,008 ක් වටිනා උපකරණ 2022 පෙබරවාරි 28 (විගණිත දිනය) වන විටත් ගබඩාවේ නිශ්කාර්යයව පැවතීම හා අදාල කාර්යයන් සඳහා යොදවා නොගැනීමෙන් ආයතනයේ සැලසුම්ගත කාර්යයන් වල කාර්යසාධනය අවම මට්ටමක පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

3.3 පාඩු හා හානි

හානි හා පාඩු පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් එවන ලද වාර්තාවල සමාලෝචිත වර්ෂයේ අවසන් ශේෂය සමඟ දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂයන් නොසැසඳුනි.

3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2021.12.31 දිනට නිකුත් කරන ලද විගණන විමසුම් 42 කින් විගණන විමසුම් 21 කට පිළිතුරු ලබා දී නොතිබූ අතර එම විගණන විමසුම් වලට අදාළ පැහැදිලි කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද ගණනය කලහැකි වටිනාකම රු. 9,947,766 ක් වී තිබුණි.

3.5 **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) විශ්‍රාම වැටුප් අංක 40-2015040 හා 4-30864 යටතේ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයා 2019 වර්ෂයේදී නැවත විවාහ වී තිබුණු අතර අනත්දරුවා එම අවස්ථාවේදී බාලවයස්කාර දරුවෙකි. 2013 සැප්තැම්බර් 20 දිනැති හා අංක 03/2013 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව මියගිය දායකයාට දාව උපන් අනත්දරුවන් සිටී නම් අනත්දරුවා වෙත අනත්දරු විශ්‍රාම වැටුප භිමි ගැන්විය යුතු වුවත් 2019 ඔක්තෝම්බර් 04 දින සිට 2021ජූලි මාසය දක්වාම විශ්‍රාම වැටුප් අංක 40-2015040 සහ 4-30864 යටතේ පිළිවෙලින් රු.598,488 හා රු.153,834 ක මුදලක් නැවත විවාහ වූ වැන්දඹුව වෙතම ගෙවා තිබුණි.

(ආ) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයින් එකොලොස් දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් ලෙස රු.3,327,180 ක්ද ද රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයින් දෙදෙනෙකුට විශ්‍රාම වැටුප් ලෙස රු.436,967 ක් ද කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති එක් විශ්‍රාමිකයෙකුට විශ්‍රාම වැටුප් ලෙස රු.48,737 ක් ද කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයන් 05 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් ලෙස රු.2,480,951 ක් ද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයෙකුට විශ්‍රාම වැටුප් ලෙස රු.797,334 ක් ද ලෙස එකතුව රු.7,091,169 ක් වැඩිපුර ගෙවා තිබු අතර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගිය විශ්‍රාමිකයින්ගෙන් අයවිය යුතු රු. 2,480,591 කින් 2022 පළමු කාර්තුවේදී රු. 1,703,249 ක්ද දෙවන කාර්තුවේදී රු. 149,193 ක් ද අයකරගෙන ඇති බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අංක 21-37920 දරන විශ්‍රාමිකයා 1994 දෙසැම්බර් 01 දින මියගොස් තිබුණද ඔහුට 2018 ජූලි මස දක්වා විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. වැඩිපුර ගෙවන ලද රු.2,268,080 කින් රු.231,780 ක මුදලක් බැංකුවේ ඉතිරිව තිබී ප්‍රාදේශීය ලේකම් විසින් ගෙන්වාගෙන තිබූ අතර තවදුරටත් අයවිය යුතු රු. 2, 036, 300 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්‍රාමිකයා මිය යාමෙන් පසු බැංකු ගිණුමට බැරවූ මුදල් ඒ විගසම බැංකුව වෙතින් ගෙන්වා ගතයුතු වුවද එලෙස කටයුතු නොකිරීමෙන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවස්ථා 02 කදී රු.92,166 ක් වෙනත් පාර්ශවයක් විසින් ලබා ගෙන තිබුණි.

(ඉ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 4කදී දීර්ඝ කාලීනව අය නොවූ වැඩිපුර ගෙවීම් රු. 159,314 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) බාලවයස්කරුවන්ගේ පාස් පොත් 10 ක් විධිමත්ව ලේඛණගත කර නොතිබූ අතර වටිනාකම රු. 801,800 වූ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ බාලවයස්කාර දරුවන් 6 කගේ බැංකු පාස් පොත් බාලවයස්කරුවාට භාරදීමට කටයුතු කර නොතිබුණි.

(උ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවකරණ ලේඛණයට අනුව විශ්‍රාමිකයන් 04 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු. 58,075 ක විශ්‍රාම වැටුපක්ද මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවකරණ ලේඛනය අනුව විශ්‍රාමිකයන් 03 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු.874,675 ක්ද අයකර නොතිබුණු අතර අය නොකිරීමට හේතුව වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් අය කිරීම නතර කර ඇති බව අවකරණ ලේඛනයේ සඳහන් කර තිබුණි.

(ඌ) විශ්‍රාම වැටුප් අංක 27-2010729 දරන අනත්දරු විශ්‍රාම වැටුප භාරකරුවෙකු යටතේ රැකවරණය ලබන අනත්දරුවන් තිදෙනාගෙන් වැඩිමහල් දරුවා 2017 සැප්තැම්බර් 10 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූවද ඇයගේ ප්‍රදාන කොටස වන 1/3 ක ප්‍රමාණය ඇතුළත් දල වශයෙන් රු. 313,937 ක්වූ අනත්දරු විශ්‍රාම වැටුප් දීමනාව දරුවා නමින් ප්‍රදානය කර නොතිබුණි.

(එ) වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීමේ ලියාපදිංචි ලේඛනයට අනුව අයදුම්පත් අදාල අංශයට ලැබී වසරකට වැඩි කාලයක් ගත වී ඇතත් ගෙවීමට නොහැකිව 2002 සිට 2020 වර්ෂය දක්වා වන කාලසීමාවට අයත් අයදුම්පත් ගණන 235 ක් ව තිබුණි.

(ඒ) විශ්‍රාමිකයා මිය ගිය බව දැනුම් දීම ප්‍රමාදවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා ඇති අවස්ථාවල එම මුදල් බැංකුවෙන් ගෙන්වා ගැනීමට කටයුතු නොකිරීම නිසා 2021 ජූලි මස සිට නොවැම්බර් මස දක්වා ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් 12 දෙනෙකුට අදාලව රු.46,620 ක්වූ වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඔ) ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා එවා තිබූ ලිපිගොණු 49 කින් අඩුපාඩු සකස් කිරීම සඳහා ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආපසු යවා තිබූ ලිපිගොණු 14 ක් 2020 වර්ෂයේදී අඩුපාඩු සකස් කර නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවා ඇතත් අනුමත කර නොතිබුණු අතර මාවතගම , මල්ලවපිටිය, කුරුණෑගල හා පුජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වල තාවකාලික ලිපිගොනු 19 ක් සඳහාද අනුමැතිය ලබා නොදීම හෝ දීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කර නොතිබීමෙන් ඒවායේ විෂමතාවයන් ගැලපීමට නොහැකි වී තිබුණි.

(ඕ) ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව වැන්දඹුව මිය යෑම නිසා විශ්‍රාමිකයන් දෙදෙනෙකුට වැඩිපුර ගෙවන ලද රු.379,428 ක මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ක) විශ්‍රාම වැටුප් අංක 4-30570 හා3-1020822 විශ්‍රාමිකයන් දත්ත පද්ධතිය තුළ පෙන්නුම් කළ ද පුජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ඔවුන් නමින් ගොනුවක් නොවුණි.

(ග) විශ්‍රාම වැටුප් අංක 4 – 4197 හා විශ්‍රාම වැටුප් අංක 1-156780 දරන විශ්‍රාමිකයාට හමුදා සේවා වැටුප හා ජීවන වියදම් දීමනාව සමඟ විශ්‍රාම වැටුප් ගෙවීම හේතුවෙන් පිළිවෙලින් රු.359,650 ක් හා රු .292,575 ක් ලෙස එකතුව රු.652,225 ක් වැඩිපුර ගෙවා තිබුණි. 1990 සිට 2014 දක්වා වර්ෂවල ගණනයන් සඳහා ප්‍රමාණවත් දත්ත නොතිබුණි.

(ක) විශ්‍රාම වැටුප් 2ක් ලබන විශ්‍රාමිකයකු විසින් ජීවිත සහතික ඉදිරිපත් නොකල හොත් විශ්‍රාම වැටුප් දෙකම අක්‍රීය කලයුතු වුවද ,විශ්‍රාම වැටුප් දෙකක් ලබන විදේශ විශ්‍රාම වැටුප් ලාභීන්ගේ එක් විශ්‍රාම වැටුපක් සක්‍රීය (ACTIVE) කර අනෙක අක්‍රීය(HOLD) කර තිබුණු අවස්ථා 47 ක් පැවතිණි.

(ඛ) විශ්‍රාම වැටුප් අංක 23-1000021 දරන අයට අනත්දරුවෙකුගේ භාරකරු වශයෙන් 2007 සිට විශ්‍රාම වැටුප් ගෙවා තිබුණද ආරම්භයේ සිට මේදක්වා ගෙවා නොමැති ජීවන වියදම් දීමනාව රු.527,862 ක් විය.

(ද) 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් ජීවත්වීමේ සහතික ලබානොදී තිබියදීත් 03 – 1173669 දරන විශ්‍රාම වැටුප් අංකයට අදාලව විශ්‍රාම වැටුප නතර කල දිනය වූ 2021 ජූලි 10 දක්වා රු.658,810.26 ක මුදලක් ගෙවා තිබුණි.

(ධ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල අතර විශ්‍රාමික ලිපිගොනුව මාරුකර තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ගඟවට කෝරලය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාමිකයකු සඳහා 2004 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් අංක 01-603037 සහ 01-1603037 යටතේ විශ්‍රාම වැටුප් දෙකක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි .මු.රෙ 104 පරීක්ෂණය මගින් 2008 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා වැඩිපුර ගෙවන ලද මුදල රු . 2,169,551 ලෙස තක්සේරු කර තිබුණ නමුත් 2008 වර්ෂයට පෙර වූ මාස 41 ක කාලයක් සඳහා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම ගණනය කර නොතිබුණි. මෙම විශ්‍රාමිකයා 2021 මාර්තු 02 දින මිය ගොස් තිබූ අතර විශ්‍රාම වැටුප නතර කල දින සිට මියගිය දිනය දක්වා ඔහුගෙන් අයකරගත් මුදල් අඩු කල පසුව තවදුරටත් රු1,847,708.85 කට මුදලක් අයකර ගැනීමට පැවතුණි.

(න) ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා 2018 ජූලි සහ 2019 ජූනි මාසවල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් නතර කරන ලද විශ්‍රාමිකයින් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවේදී තිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකු සහ කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු මිය යාම හේතුවෙන් ජීවිත සහතික ඉදිරිපත්කර නොතිබුණි.විශ්‍රාමිකයා මියයාම ග්‍රාම නිලධාරී හෝ පවුල්වල ඥාතීන් විසින් වැටුප් අංශය වෙත දැනුම් නොදීම හේතුකොට ගෙන මියගිය දින සිට ප්‍රධාන කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් නතර කරන තෙක් එකතු වටිනාකම රු.2,068,762 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවූ මුදල් හදුනාගෙන මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව කටයුතු කර නැවත අයකර ගැනීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ණ) අංක 1-603326 හා 21-500158 මගින් සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට මිය ගිය විශ්‍රාමික නිලධාරිනියක් වෙත වැඩිපුර ගෙවා තිබුණු රු.2,696,303 ක් වූ විශ්‍රාම වැටුපෙන් 2021 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණු මුදල රු .2,388,251 ක් වී තිබුණි.

(ප) අංක 01-600772 යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිට 2013නොවැම්බර් 07දින මියගිය නිලධාරිණියගේ බැංකු ගිණුමට ඇය මිය ගොස් මාස 29ක කාලයක් දක්වා රු582.,423 ක් විශ්‍රාම වැටුප් ප්‍රේෂණය කර තිබුණි.එයින් රු.581 ,916 ක් ATM කාඩ්පතක් භාවිතා කරමින් ඉවත් කර ගෙන තිබූ නමුත් 2021 දෙසැම්බර් 31වන විටත් එම මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(එ) දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් අංක 105353-0-21 දරන විශ්‍රාමිකයා ගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට විශ්‍රාමිකයා ගේ දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකය යොදා විශ්‍රාමිකයා මිය ගොස් මාස 86ක කාලයක් ගතවන තෙක් විශ්‍රාම වැටුප ලෙස රු1,562,470 . ක් ගෙවා තිබුණි.එම මුදල් ඇයගේ දියණිය විසින් ලබාගෙන තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ග, හෝ විනය ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු විගණනයට වාර්තා නොවූ අතර මෙම වැඩිපුර ගෙවූ මුදලින් රු. 1,036,336 ක මුදලක් තවදුරටත් අය කර ගැනීමට පැවතිණි.

(බ) ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරිනියක විසින් හිමිකම් නොමැති හමුදා වැන්දඹුවකගේ ගිණුමට රු 1,596,640.ක් බැර කර එම මුදල් විශ්‍රාම වැටුප් නිලධාරිනිය විසින් ලබා ගෙන තිබුණි .මේ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2012ඔක්තෝබර් 22 වන විට රු.1,000,000 ක මුදලක් නිලධාරිනිය විසින් ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගෙවා තිබුණි .එම මුදලින් තවදුරත් අය කර ගැනීමට තිබූ මුදල්2021 දෙසැම්බර් 31වන විටත් අයකරගෙන නොතිබුණි.

(භ) කුරුවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ දත්ත වෙනස් කරමින් හිහ විශ්‍රාම වැටුප් ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටි ගණකාධිකාරිවරයා විසින් 2009 වර්ෂය සිට 2020 වර්ෂය දක්වා රු 6,758,120 .ක් ඔහුගේ ගිණුමට බැර කර ගෙන තිබුණි. මෙම මුදල් 2021 දෙසැම්බර් 31වන විට අය කර නොතිබුණි.

(ම) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවදුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රු.මිලියන 597 ක් වී තිබුණි. මෙම ශේෂය වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.241,187 ක්ද වර්ෂ 5 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රු.මිලියන 39 කින් ද හා වර්ෂ 5 ට අඩු කාලයකට අයත් රු.මිලියන 558 කින් ද සමන්විත විය.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති තිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොමැත. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

මු.රේ. 133 (2) අ (1) ප්‍රකාරව, අභ්‍යන්තර විගණනය විසින් ආයතනයේ මුදල් කටයුතු පිළිබඳව පාලන ක්‍රම වල වැරදි හා වංචා වැලැක්වීම සඳහා දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි වල විධිමත් බව,ප්‍රමාණවත් බව අඛණ්ඩව සමීක්ෂණය හා සැලසුම් හා තත්‍ය ක්‍රියාකාරීත්වය සාර්ථක දැයි සොයා බැලීම කල යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව,අනෙකුත් විගණනයන්ට අමතරව ආයතනයේ අංශ දෙකක විගණන කටයුතු සිදුකිරීමට සැලසුම් කර තිබුණද ,එම කාර්යයන් ඉටුකර නොනිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

(අ) ආයතන සංග්‍රහයේ II පරිවිඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්කිරීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන් අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 3 ක් හා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කර ඇති විශ්‍රාම වැටුප් නිලධාරීන් 25 ක් සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණි. එම තනතුරුවල වැඩ බැලීමේ කාලය 2021 දෙසැම්බර් 31 දින වන විට මාස 2 සිට මාස 89 දක්වා වී තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය 1192 ක් හා සත්‍ය කාර්ය මණ්ඩලය 1049 ක් වූයෙන් පුරප්පාඩු 143 ක් විය.සත්‍ය කාර්ය මණ්ඩලය තුල අනුමත නොවූ අතියම් තනතුරු 06 ක් හා කොන්ත්‍රාත් තනතුරු 02 ක් පැවතිණි.

කේ.සී.පී.සේනාරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්එස්ඩබ්/ඊ/ඩීඔපී/02/22/24 මෙම අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජූනි 22 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ක ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පූර්ව වර්ෂවලට අදාලව හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ දායක මුද්ල රු.91,246,749 ක් , මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 302 ක රු. 1,117,176,437 ක්වූ ලැබිය යුතු දායක මුදලින් පළාත් පාලන ආයතන 123 කට අදාලව රු. 566,236,315 ක ලැබිය යුතු දායක මුදල් සඳහා ශේෂය තහවුරු කිරීම් ලැබී නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 84 ක 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල රු. 296,675,317 ක් වුවත් පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල රු. 51,783,885 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 244,891,432 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 14 ක 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල රු. 31,440,706 ක් වුවද පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල රු. 47,924,861 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 16,484,155 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 07 ක 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දායක මුදල් රු.256,491 ක් වුවත් පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු. 117,690 ක ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල් අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම් හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ (අ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අගෝස්තු 28 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මඟින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876 (2)(ආ)	අරමුදල් මඟින් අපේක්ෂිත අරමුණු රජයේ අයවැය යටතේ ඉටුකර ගත හැකි නම් එකී අරමුදල්වල කටයුතු අවසන් කල යුතු බවද දක්වා ඇත. ඒ අනුව මෙම අරමුදලේ කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ, අයවැය ප්‍රතිපාදන සලසාගෙන සිදු කරන බව හා අරමුදල අක්‍රිය තත්වයේ පවතින බව ගිණුම් සටහන් අංක 4 මඟින් හෙලිදරව් කර ඇති නමුත් අරමුදල වසා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.
(ආ) 2012 පෙබරවාරි 08 දිනැති අංක 01/2012 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	ඒ ඒ මාසයේ අරමුදලට අදාල සාමාජිකයන්ගේ මියයෑම් පිළිබඳ වාර්තා ඊළඟ මාසයේ 25 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ගෙන්වාගෙන එම වාර්තා අනුව කාලීනව මියයෑම් ගැලපීමට පියවර ගත යුතුය. එසේ නොකිරීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය අතර කාලයේ දී මියගිය සාමාජිකයන් 583 ක ගේ

ඉකුත් වර්ෂය දක්වා ලැබිය යුතු මියයෑම්වලට අදාල රු.4,147,147 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු දායක මුදල් ගිණුමට හා සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා තිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පළාත් පාලන ආයතන වලින් වර්ෂය තුල ආයක මුදල් ලැබීම් රු. 91,246,749 ක්ම විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස දක්වා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් විශ්‍රාමිකයන් 44,018 ක් සඳහා රු. 946,249,496 ක දයක මුදල් ගෙවා තිබීම හේතුවෙන් අරමුදලින් බලාපොරොත්තු වන අරමුණු ඉටු වී නොතිබුණි.

3.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 302 කින් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 455,320,462 දායක මුදල් වර්ෂය තුලදී ලැබී නොතිබුණි.

(ආ) නිරප්පනේ පළාත් පාලන ආයතනයේ මියගිය සාමාජිකයෙකු ගෙන් අයවිය යුතු රු.435,356 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ /ඊ/සිඔඉ/02/22/25 මෙබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලයෙන් 2021 අප්‍රේල් මාසයට අදාල දායක මුදල් ලෙස 2021 ජුනි 25 දින ලැබූ රු.2,904,049 ක් වර්ෂයේ ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල ලැබිය යුතු දායක මුදල් රු.20,933,783 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණ ද, අවසන් ගිණුමට ගැලපීමේ දී ඉකුත් වර්ෂයට අදාල ලැබිය යුතු ශේෂය රු.19,069,163 ක් වීම හේතුවෙන් රු.1,864,620 ක් සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් රු.6,636,632 ක් විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම රු.6,354,633 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් දායක මුදල් හා ලැබිය යුතු දායක මුදල් රු.281,999 ක් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පිටුව 2 | 6

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත	
(i) නියෝග අංක 04	ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතුය. එසේ වුවද, දායක මුදල් රැස්කිරීම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කර තිබුණි.
(ii) නියෝග අංක 9(අ)	එක් එක් දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. තවද පළාත් 09 න් පළාත් 06 කින් පමණක් දායක මුදල් අරමුදලට ලැබී තිබුණු අතර අනෙක් පළාත්වලින් දායක මුදල් නොලැබීමට හේතු හෙළිදරව් නොවුණි

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂයේ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව, අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව සතු සාමාජිකයන්ගේ නම, පාසල, ඇතුළත් උපලේඛනයක් නඩත්තු නොකිරීම හේතුවෙන් අරමුදලට වාර්ෂිකව සත්‍ය වශයෙන්ම ලැබිය යුතු මුදල, ලැබූ මුදල හා හිඟ මුදල් පිළිබඳ තොරතුරු නිවැරදිව වෙන් වෙන්ව හඳුනාගැනීමට නොහැකිව තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/ඊ/සිඔඉ/02/22/28

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූලි 11 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව සියලු ආදායම් වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවත් වර්ෂය තුල ලැබී නිබුණු රු.378,828,149 ක් වූ අනිවාර්ය දායක මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කර නිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) ගිණුම් සටහන් 3.8 අනුව උපචිත වියදම් රු.14,904,137 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.14,554,137 ක් ලෙස දැක්වීම හේතුවෙන් වියදම් හා ජංගම වගකීම් රු.350,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තු රු.1,055,000 ක් විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,153,760 ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයට අදාලව ගෙවිය යුතු විගණන ගාස්තු රු.98,760 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) අරමුදලේ ආරම්භක සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂයේ අලුතින් එකතු වූ සාමාජික සංඛ්‍යාව, වර්ෂය තුළ ගෙවීම් කර ඉවත් වූ සාමාජික සංඛ්‍යාව, අවසාන දිනට අරමුදලේ සාමාජික සංඛ්‍යාව කොපමණද යන්න තහවුරු කිරීමට සාමාජික ලේඛණය විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු.31,284,678,563 ක් ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය 48,191,933 ක් හා රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු.48,313,024,475 ක් වූ ශේෂයන් දායකයන්ගේ හිමිකම අනුව වෙන්කර හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී රු.85,016,374 ක් රජයේ දායක මුදල් ලෙස ගෙවා තිබූ අතර එම ගෙවීමට යටත් වූ දායකලාභින්ගෙන්අරමුදලට සත්‍ය වශයෙන්ම දායක මුදල් ලැබුනේද යන්න තහවුරු කර ගැනීමෙන් තොරව සේවය කළ ආයතනයේ තහවුරුව මත පමණක් පදනම්ව ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඊ) මාසික ගිණුම් සාරාංශ මඟින් විවිධ රජයේ ආයතන විසින් අරමුදලේ ගිණුමට සිදු කරන ලද හර හා බැර කිරීම් වලට අදාල හඳුනානොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමට ගලපා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මෙසේ හඳුනා නොගත් ගැලපුම් ගිණුමෙහි පවතින වසර ගණනාවක සිට එකතු වෙමින් එන ශේෂය රු.29,811,315 ක් විය. එම ශේෂය සැකසී ඇති ආකාරය පිලිබඳ විස්තරාත්මක උපලෙඛනයක් ඉදිරිපත් නොවීම හේතුවෙන් එය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ඉහත විස්තර කර ඇති පරිදි ශේෂ පත්‍රයේ, ආදායම් හා වියදම් ගිණුමේ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මෙ හේතුවෙන්, ශේෂ පත්‍රය ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

පිටුව 2 | 4

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ "ඇ" හා "ඊ" ශ්‍රේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

අරමුදලේ සාමාජිකයන් විසින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද 2021 ජනවාරි 01 දිනට පැවති අයදුම්පත්‍ර සංඛ්‍යාව 987ක් වූ අතර, 2021 වර්ෂයට අදාලව ලැබී තිබූ අයදුම්පත්‍ර 5059ක් ද සමඟ අයදුම්පත් 6046 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත්‍ර 1363 ක් සඳහා ගෙවීම් කර නොනිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

4

කාර්ය සාධන දර්ශක

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
නව විශ්‍රාම වැටුප් ප්‍රදානය	විශ්‍රාම වැටුප් ප්‍රදානය - විමධ්‍යගත	2021 වර්ෂයේ විශ්‍රාම වැටුප් ප්‍රදාන ලබාගත් විශ්‍රාමිකයින් ගණන	30,000	96.18%			
	විශ්‍රාම වැටුප් ප්‍රදානය- මධ්‍යගත		1,650			69.87%	
	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය		8,000	90.12%			
සංශෝධන ගෙවීම්	විශ්‍රාම වැටුප් සංශෝධන - විමධ්‍යගත	ගෙවූ සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රමාණය	5,000				* 26.12%
	විශ්‍රාම වැටුප් සංශෝධන - මධ්‍යගත		650				* 35.23%
පාරිතෝෂික හා වෙනත් ගෙවීම්	මරණ පාරිතෝෂිකය		1,100	95.63%			
	ආබාධිත විශ්‍රාම වැටුප්		7,000	100.20%			
	සත්කාර පියස	සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද සංඛ්‍යාව	30,000				* 39%
මාසික විශ්‍රාම වැටුප්	මාසික විශ්‍රාම වැටුප් සිවිල්	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	483,460	100%			
	පාරිතෝෂික ගෙවීම හා ණය වාරික	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	42,000		72%		
සමාජ සුභසාධන	ත්‍රිවිධ හමුදා සහ පොලිස්	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	41,962	98.88%			
වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	196,540	100%			

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
වැන්දඹු හා අනත්දරු දායක මුදල් අදායම : ආදායම් රැස් කිරීම	මධ්‍යම රජය	මාසික අදායම	23,500*		87.33%		
	පළාත් සභා	මාසික අදායම	12,500*	96.41%			
	ගුරු වැන්දඹු අනත්දරු	මාසික අදායම	180*	161.07%			
වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම.	සිවිල්	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	1500				* 47.2%
	හමුදා	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	1000	** 213.9%			
	ගුරු වැන්දඹු අනත්දරු	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	40	102.5%			
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල	රා.සේ.අ.අ. සාමාජිකයින් සංඛ්‍යාව	වාර්ෂික නව සාමාජිකයින් සංඛ්‍යාව	8,400	118.4%			
	දායක මුදල් ගෙවීම්	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	6,000			64.18%	
	දායක මුදල් ලැබීම්	මාසික දායකත්වය 8% හා 12%	900*	132%			
	ආයෝජන	වර්ෂය තුල සිදු කරන ලද නව ආයෝජන	7,200*	107.52%			
මානව සම්පත් සංවර්ධනය	ධාරිතා සංවර්ධනය	පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම			75%		
දෘඩාංග සංවර්ධන කටයුතු	ඇගිලි සළකුණු යන්ත්‍ර මිලදී ගැනීම	ඇගිලි සළකුණු යන්ත්‍ර ගණන	10	100%			
පද්ධති ආරක්ෂාව	ප්‍රති වෛරස් මෘදුකාංග යාවත්කාලීන කිරීම			100%			
ජාලගතකරණය	CERT(New)			100%			
	Fire wall			100%			

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
ආයතනික පරිසරය වැඩි දියුණු කිරීම	සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විශ්‍රාමිකයින් හට රැඳී සිටීම සඳහා භෝජනාගාරයේ කොටසක් වෙන් කිරීම	2021 වර්ෂය තුල සියළුම ව්‍යාපෘති අවසන් කිරීම		100%			
	රත්ගම සහ පඬුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් අංශ නවීකරණය කිරීම			95%			
	රම්බොඩ නිවාඩු නිකේතනය නවීකරණය කිරීම			100%			
	කැළණිය නිවාඩු නිකේතනය නවීකරණය කිරීම						35%
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම	සිවිල්	විශ්‍රාමිකයින් ගණන	8,000	99.73%			
	හමුදා						
	විෂමතා						
විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම	සිවිල් විශ්‍රාම වැටුප්	විශ්‍රාමිකයන් හා වැන්දඹුවන් සංඛ්‍යාව	350				* 39.71%
	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්		250				* 27.02%
	විශ්‍රාම වැටුප් සංශෝධන		400	*** 195%			
	හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම(දස අවුරුදු, සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍ර)		500		80%		

*ආදායම් ලැබීම්

*දිවයින පුරා ව්‍යාප්තව පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි සිදු නොවීම හේතුවෙන් සහ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් අයදුම්පත් ලැබීම හේතුවෙන් එම ක්‍රියාකාරකම්හි ප්‍රගතිය අඩුවී ඇත.

**2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද හමුදා නිලධාරීන්ගේ වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම් ප්‍රමාණය 1000 ක් වන අතර වර්ෂය තුල 2139 ක් සඳහා දායක මුදල් ගෙවීම් සිදු කර ඇත. ප්‍රතිශතයක් ලෙස ලත් කළ විය 213.9% ක් වේ.

***2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද විශ්‍රාම වැටුප් සංශෝධන ගෙවීම් ප්‍රමාණය 400 ක් වන අතර වර්ෂය තුල 780 ක් සඳහා ගෙවීම් සිදු කර ඇත. ප්‍රතිශතයක් ලෙස ගත් කළ විය 195% ක් වේ.

5

තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1.හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
කොතනක හෝ පවතින ඕනෑම ආකාරයකින් වන දුගී බව අවසන් කිරීම.	2030 වන විට සාධාරණ හා තිරසාර හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් පිහිටුවීම හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	රජයේ විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව)			

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

මෙරට සෑම පුරවැසියෙකුටම විශ්‍රාම වැටුප් හිමිකමක් ලබාදීමට අදාලව යෝජනා ඉදිරිපත් කරමින් “සැමට විශ්‍රාම” ප්‍රතිපත්තිමය යෝජනාවලිය රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති අතර අමාත්‍යාංශය වෙතින් මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලැබිය යුතුව ඇත.

6

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	34	30	04
තෘතියික	11	05	06
ද්විතියික	1078	954	124
ප්‍රාථමික	75	52	23
එකතුව	**1198**	**1041**	**157**

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	පුහුණු වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේ ස්වාභාවය (විදේශීය/ දේශීය)
			දේශීය	විදේශීය	
ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිය	01	වසර 02	415,000		දේශීය
ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිය	01	වසර 02	575,000		
Installment Payment for Diploma in Diplomacy & world affairs course 2020/2021	02	වසර 01	180,000		
CIMA Annual Subscription	01	වසර 01	81,560.04		
Masters of Applied Finance	02	වසර 01	830,000		
Newly Appointed DO – Introduction Training	50	සති 01	44,815		
Public relations for call center staff	08	දින 01	5,280		
Pension Payment System (Online)	200	දින 01	4,134 (For Link)		

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	පුහුණු වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේ ස්වාභාවය (විදේශීය/ දේශීය)
			දේශීය	විදේශීය	
Pension Payment System (Online)	150	දින 01	-		දේශීය
Improving efficiency of Drivers	15	දින 01	33,584		
Pension Payment System (Online)	150	දින 01	3,134 (For Link)		
Master in Business Administration	01	වසර 02	50,000 (Registration fee)		

7

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම			
1.6	වෙනත්			
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)**			
2.1	රා.ප.ව. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ.	වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් සොයා බලා නිවැරදි කිරීම් කර, පිළිතුරු ඉදිරිපත් කිරීමේදී කාල ප්‍රමාදයක් සිදුවීම.	
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මුදල් රෙගුලාසි 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	අනුකූල වේ.		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් පිළිතුරු ලබා ගැනීමේදී කාල ප්‍රමාදයක් ඇතිවීම	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටුව**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්තුවකට වරක් බැගින් වසරකට කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.	
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		

11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට වලඹීම	අනුකූල වේ.	පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම නිසා ප්‍රතිපාදන ඉක්මවූ බැරකම් පවතී.	
12.	**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ පවතී.	
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		

15.	**ආදායම් හිඟුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු හිඟුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ.		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ.	ආයතනයේ කාර්යභාරයට අනුකූලව සකස් කරන ලද පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වේ.	

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	ආයතනයේ අවශ්‍යතාවයට සුදුසු පරිදි මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	මාණ්ඩලික නිලධාරීන් සඳහා පමණක් මෙම ගිවිසුම් අත්සන් කරයි.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20.	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.	විගණනය විසින් පෙන්වා දී තිබූ බොහෝ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	



ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත, කොළඹ 10
ஓய்வூதியத் திணைக்களம், மாளிகாவத்தை, கொழும்பு -10.
Department of pensions, Maligawaththa, Colombo 10

www.pensions.gov.lk